**ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් මහජනයා වෙත ලබා දෙන සේවාවන් සඳහා එක් එක් ආදායම් සංකේත යටතේ දෛනිකව ලැබිය යුතු ආදායම නිවැරදිව එකතු වන බව තහවුරු කර ගැනීම සඳහා ලබා දෙන සේවාවන් අනුව ආදායම හා ලද ආදායම සැසඳීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හේතුවෙන් සපයන සේවාවන් හා සබැඳිව | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පවතින bank link ආදායම් අධීක්ෂණ පරිගණක පද්ධතිය මඟින් දෙපාර්තමේන්තුවේ දෛනික ආදායම් රැස් කිරීම බැංකු ගිණුම් සමඟ දෛනිකව සසඳා තහවුරු | දෙපාර්තමේන්තුව සැපයූ සේවාවන් අනුව ලැබිය යුතු ආදායම හා ලද ආදායම දෛනිකව සැසඳීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අයවිය යුතු ආදායම නිසි ලෙස ගිණුම් ගත වී ඇති බව තහවුරු කර ගැනීමකින් තොරව රු.9,636,851,446ක බැංකුවට ලද ආදායම ගිණුම් ගත කර තිබුණි. | කිරීමෙන් පසුව දෛනික ආදායම් ගිණුම් ගත කරනු ලැබේ. 2003.02.14, 1003.07.09, 1003.07.04 හා 2003.02.15 ආදායම් සංකේත යටතේ රැස්කළ සමස්ථ ආදායම රු. 9,636,851,446 නිවැරදි බව | |
| (ii) | දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල මඟින් සපයන සේවාවන් සඳහා අය කරනු ලබන ආදායම් සිගාස් පරිගණක පද්ධතිය මඟින් දෙපාර්තමේන්තු ශීර්ෂය වෙත බැර කර ඇති අතර එලෙස බැර කර ඇති ආදායම තහවුරු කර ගැනීම සඳහා දිස්ත්‍රික් කාර්යාල වෙතින් විස්තරාත්මක ආදායම් වාර්තා ලබාගෙන නොතිබුණි. ඒ අනුව දිස්ත්‍රික් කාර්යාල වෙතින් ලැබී ඇති රු.5,718,932,894ක ආදායම නිවැරදි බව තහවුරු කර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. | මු.රෙ. 135 යටතේ වන බලතල පැවරීමට අනුකූලව දිස්ත්‍රික් කාර්යාල මඟින් රැස් කරන ආදායම් සිගාස් පද්ධතිය මඟින් වාර්තා කරන අතර එහි නිරවද්‍යතාවය මාසික ගිණුම් සාරාංශ සමඟ දිස්ත්‍රික් කාර්යාල හා සම්බන්ධ වී සැසඳීම් සිදු කර නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සිදුවේ. විගණන අවශ්‍යතාවය මත දිස්ත්‍රික් කාර්යාල සනාථන ලබා දීමට හැකි බව | දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් රැස්කර ඇති ආදායම් තහවුරු කර ගැනීමට අදාල උපලේඛණ මාසිකව ගෙන්වා ගත යුතුය. |
| (iii) | දිස්ත්‍රික් කාර්යාල මඟින් දෙපාර්තමේන්තු ශීර්ෂය වෙත ආදායම් බැර කිරීමට භාවිතා කරන ලද සංකේත ආදායම් සංකේත 3කට අවස්ථා කිහිපයකදී එකතු වටිනාකම රු.46,113,388ක් හර කර, දෙපාර්තමේන්තු ආදායම් ශීර්ෂයට බැර කර තිබූ ආදායම නැවත ලබා ගෙන තිබූ නමුත් එකී හර කිරීම්වලට හේතු වූ කරුණු හා එම හර කිරීම් දෙපාර්තමේන්තුවට අදාල වන ආකාරය තහවුරු කිරීමට උපයෝගී ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2003.02.14 ආදායම් සංකේතයට අදාලව ආදායම් බැර කිරීමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් සිදු වූ දෝෂ නිවැරදි කිරීම් වශයෙන් හර කළ රු. 16,137,940 හා ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව විසින් ආදායම් බැර කිරීමේදී සිදු වූ දෝෂ නිවැරදි කිරීම් වශයෙන් හර කළ රු. 2,422,400 වශයෙන් සමස්ථ රු. 18,560,340 ක් ආදායම් සංකේතයට හර කර ඇත. | වැරදි නිවැරදි කිරීම් සිදුකර ඇති ජ'නල් සටහන් හා ඊට අදාළ උපයෝගී ලේඛන දිස්ත්‍රික් කාර්යාල වලින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුයි |
| (iv) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ආදායම් සංකේතය 3කට අදාලව රැස්කරගත් ආදායමට එරෙහිව එකතු වටිනාකම රු.121,456,065ක් එකී ආදායම් ගිණුම්වලට හරකර තිබුණු අතර එම හර කිරීම් වලට හේතු වූ කරුණු හා හර කිරීම්වලට අදාල උපයෝගී ලේඛණ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2003.02.14 හා 1003.07.04 ආදායම් සංකේතයන්ට පිළිවෙලින් රු. 93,696,499 ක් හා රු. 27,744,566 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිදු කළ ආදායමින් ආපසු ගැනීමක් වේ. 2023 මාර්තු මාසයේ ATM යන්ත්‍රයේ කුලී ආදායම 2002.01.01 ආදායම් ශීර්ෂයට බැර කළ යුතු වුවත් වැරදීමකින් එය 1003.07.09 ආදායම් සංකේතයට බැර වීමෙන් සිදු වූ වරද දෙසැම්බර් මාසයේදී නිවැරදි කිරීම මඟින් මෙම වටිනාකම ඇති වී ඇත. | උපයෝගී ලේඛන පවත්වාගෙන යා යුතුය. |
| (v) | මුදල් රෙගුලාසි 128(2)(ඇ), මුදල් රෙගුලාසි 176 (1) සහ අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය අනුව එක් එක් ආදායම් සංකේතය යටතේ හිඟ ආදායම් ගණනය කොට මූල්‍ය ප්‍රකාශනවල | 1003.07.09 කාබන් බදු ආදායම් සංකේතය යටතේ රැස් කරන කාබන් බද්ද 2019.12.01 සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කර | බද්දක් අහෝසි කළද එකී බද්දට අදාල ලැබිය යුතු හිඟ ආදායම් වාර්තා පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| දැක්විය යුතු නමුත් 1003-07-09 දරණ ආදායම් සංකේතය යටතේ පසුගිය වර්ෂය වෙනුවෙන් හිඟ ආදායම් ගිණුම් ගත කර නොතිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී උක්ත ආදායම් සංකේතය යටතේ රු.7,081,678 හිඟ ආදායම් අය කර ගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ද උක්ත ආදායම් සංකේතය යටතේ හිඟ ආදායම් පැවතිය හැකි බැවින් හිඟ ආදායම් නිවැරදිව ගණනය වී නොමැති බව නිරීක්ෂණය විය. | ඇත.<br>2015/01 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය යටතේ අහෝසි කරන ලද හෝ අයවී අවසන් වූ බදු වලට අදාලව හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීමේ හෝ ගණනය කිරීමේ අවශ්‍යතාවය නොමැති බව | |

**(ආ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පුනරාවර්තන ස්වභාවයේ ගනුදෙනු ලෙස වර්ගීකරණය කල යුතු හා පුනරාවර්තන වැය විෂයයන් මඟින් වැය දැරිය යුතුව පැවති වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා දරන ලද රු.39,834,000ක ටෝනර් මිලදී ගැනීමේ පිරිවැය 307-2-1-1-2509 යන වැය විෂයය යටතේ ප්‍රාග්ධන ප්‍රතිපාදන මඟින් උපයෝජනය කර තිබුණි. | 307-2-1-0-2509 දරණ වැය විෂය යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ වේරහැර කාර්යාලයේ රියදුරු බලපත්‍ර මුද්‍රණ කටයුතු වලට අදාල සියළුම වියදම් දැරීම සඳහාය. ඒ අනුව ටෝනර් මිලදී ගැනීම ඇතුළු මෙම කාර්යය සඳහා ඍජුවම සම්බන්ධ වන සියළුම වියදම් පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වශයෙන් වර්ග කිරීමකින් තොරව සෑම වසරකම මෙම වැය විෂයෙන් වියදම් කර තිබේ. | අයභාර වියදම් මූලධන ප්‍රතිපාදන මඟින් නොදැරිය යුතුය. |
| (ii) | ඒ.සී.ඒ 2(ii) වියදම් ප්‍රකාශය අනුව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ දක්වා ඇති මූලධන වියදම්වල ශේෂයන් 2ක් (307-2-1-0-2001, 307-2-1-0-2002) හා ඊට අදාල දෙපාර්තමේන්තු වැය ලෙජර ශේෂයන් අතර රු.1,105,650ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි.<br>2024 වර්ෂයේ වැය ලෙජර නිවැරදිව පවත්වාගෙන යාමට ක්‍රියා කරමි. | දෙපාර්තමේන්තු වැය ලෙජර නිවැරදිව පවත්වාගෙන යා යුතුය. |

**(ඇ) මූල්‍ය නොවන වත්කම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මීගහ කිවුල ගොඩනැගිලි ඉදිකිරීම් හා ස්පර්ශක ක්‍රමය ඔස්සේ විභාග සිදු කිරීම (307-2-1-10-2104) සහ ගොඩනැගිලි ඉදි කිරීම (307-2-1-12-2104) යන වැය විෂයයන් තුලින් වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ 14ක ශීර්ෂයන් යටතේ සමාලෝචිත වර්ෂය තුල රු.39,367,319ක ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත් එකී වත්කම් මූල්‍ය නොවන වත්කම් තුල ඇතුලත් නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂය තුල 307-2-1-10-2104 යටතේ ප්‍රතිපාදිත මුදල් දිස්ත්‍රික් කාර්යාල වල පවතින ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සහ එකතු කිරීම් සඳහා උපයෝජනය කර ඇති අතර සියළු වියදම් දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන වෙන් කිරීම හරහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වලින් වියදම් කරනු ලැබේ. මෙහිදී නව | මූලධන වියදම අදාල කර ගන්නා වැය ශීර්ෂය මඟින් වත්කම ගිණුම්ගත කල යුතුය. |

| | | |
|---|---|---|
| | වත්කමක් ඇති නොවන බැවින් මූල්‍ය නොවන වත්කම් ලෙස Cigas පද්ධතියට ඇතුලත් කර නොමැත. | |

**(ඈ) දේපල පිරියත හා උපකරණ සංචිතය**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ දේපල පිරියත හා උපකරණ සංචිතය ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අත්පත් කරගත් එකතු වටිනාකම රු.107,486,776ක දේපල පිරියත හා උපකරණ**,** සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට (එස්.ඒ.82) ඇතුලත් නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත් දේපල පිරියත හා උපකරණ සංචිතය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුල මිලදී ගත් රු. 68,119,457.00 ක් වටිනා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ පරිගණක මෘදුකාංග Cigas පරිගණක පද්ධතිය යටතේ වත්කම් ලෙස ඇතුලත් කලද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වලින් ඉවත් කිරීම හේතුවෙන් එම වටිනාකම වත්කම් ප්‍රකාශනයට (SA-52) ඇතුලත් නොකල අතර 2104 වැය විෂය යටතේ වියදම් කර ඇත්තේ පවතින ගොඩනැගිලි වලට වැඩිදියුනු කිරීම් හා එකතු කිරීම් සඳහා බැවින් රු.39,367,319.00 වියදම වෙනුවෙන් වත්කම් ඇතුලත් නොකල නිසා එයද වත්කම් ප්‍රකාශයට ඇතුලත් කර නොමැත. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපල පිරියත හා උපකරණ සංචිතය නිසි පරිදි ගිණුම් තැබිය යුතුය. |

**(ඉ) තැන්පතු**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ තැන්පත් ගෙවීම් හා ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දිස්ත්‍රික් කාර්යාලවල පවත්වාගෙන යන තැන්පතු ගිණුම් 03කට අදාලව රු.2,537,257ක තැන්පතු ශේෂයක් විසර්ජන ගිණුමට ඇතුළත් කර ඇති නමුත් ඊට අදාළ කාල විශ්ලේෂණයක් සහිත කේවල ශේෂ ලැයිස්තුවක් විගණනය වෙත ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම තැන්පතු ශේෂයෙහි නිවැරදිතාවය හා මුදල් රෙගුලාසි 570ට හා 571ට අනුකූලතාවය පරීක්ෂා කළ නොහැකි විය. | දෙපාර්තමේන්තුවට අයත් පොදු තැන්පත් ගිණුම් වෙත වසර ගණනාවක සිට දිස්ත්‍රික් කාර්යාල විසින් මුදල් බැර කිරීම් හා හර කිරීම සිදු කිරීම හේතුවෙන් පවතින මෙම හඳුනාගැනීමට නොහැකි ශේෂ පිළිබඳ තොරතුරු සපයන ලෙස සියළුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත හා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ලිපි යවා ඇති අතර කාර්යාල කිහිපයක් 2023 වසර තුල හර /බැර කරන ලද මුදල් පිළිබඳ විස්තර එවා තිබේ.මෙම ශේෂ සම්බන්ධ කාල විශ්ලේෂණය සකස් කිරිමට සියළු ශේෂ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ. | දිස්ත්‍රික් කාර්යාල මගින් තැන්පතු ගිණුමට සිදුකරන ගණුදෙනු සම්බන්ධයෙන් විස්තරාත්මක තොරතුරු ඇතුළත් ලැයිස්තුවක් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා දැනුවත් කිරීමකින් තොරව හා අදාළ ගනුදෙනු සඳහා වන විස්තරාත්මක ලේඛන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමකින් තොරව 2023 වර්ෂය තුළ තැන්පතු ගිණුම් තුනකට අදාල රු.6,785,391ක් වෙනත් ශීර්ෂයන් විසින් හරකර අරමුදල් නිදහස් කරගෙන තිබුණි. | -එම- | අනෙකුත් ශීර්ෂ විසින් තැන්පතු ගිණුමට කර ඇති හර කිරීම් හා බැර කිරීම් තහවුරු කෙරෙන ලේඛන ඇතුළත් විස්තරාත්මක උපලේඛන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් 2022 වර්ෂයේ අවස්ථා දෙකකදී හා 2023 වර්ෂයේ අවස්ථා දෙකකදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු තැන්පතු ගිණුමට අදාළව කිසිදු ගනුදෙනුවක් සිදු නොකරන ලෙස සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර ඇතත් බැර කිරීම්වලට හේතු හා බැර කරන ලද ශේෂයන් සම්බන්ධ විස්තරාත්මක ලේඛනයන්ගෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.1,558,412 මුදලක් තැන්පතු ගිණුම් තුනකට බැර කර තිබුණි. | මෙම ගිණුම් අංක වෙත තැන්පත් ගණුදෙණු නොකරන ලෙස 2022 වසරේ සිට 2024 දක්වා අඛණ්ඩව දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනුවත් කිරීම මත 2024 වර්ෂය වන විට බොහෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල හර/බැර කිරීම් නවත්වා තිබේ. 2024 පෙබරවාරි මස වන විට මසකට එක් ගිණුමකට ගනුදෙණු 2 ක් දක්වා අවම කර ගැනීමට හැකි වී තිබේ.<br>තවද දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත මෙලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් පොදු තැන්පතු ගිණුම් වලට සෘජුවම ගණුදෙණු කිරීම වැලැක්වීමට රාජ්‍ය ගිනුම දෙපාර්තමේන්තුව විසින් සිගාස් වැඩසටහනේ වසර අග Year end process අවස්ථාවේදී අවහිර කිරීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල හැකි බව ලිඛිතව දැනුම් දී තිබේ. | අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තු තැන්පතු ගිණුමට අදාළව ගණුදෙනු ඇතුළත් කිරීම වැලැක්විය යුතුය. |

**(ඊ) අත්තිකාරම් ගිණුම් ශේෂ**

අත්තිකාරම් ගිණුම්වල වර්ෂය අවසානයට වූ ශේෂ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තු පොත් (සීසී 10 ආකෘතිය) අනුව ආපදා ණය කේවල ශේෂයන් හා අත්තිකාරම් ‘බී’ ගිණුමෙහි ඇතුළත් ආපදා ණය කේවල ශේෂයන් අතර නිලධාරීන් 70දෙනෙකුට අදාළව රු.890,847ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව දෙපාර්තමේන්තුවේ සේවය කරන නිලධාරීන්ගේ ණය ශේෂය රු.126,636,539ක් විය යුතු වුවත් රු.125,745,692ක් ලෙස අත්තිකාරම් ‘බී’ ගිණුමෙහි දක්වා තිබුණි. | 2023 වර්ෂයේ අත්තිකාරම් බී ගිණුම පිළියෙල කිරීමේ දි මූලික ලියවිලි උපයෝගි කර ගෙන සකස් කරන ලදී. ඒ අනුව එම ගිණුම සමග ඉදිරිපත් කර ඇති කේවල ශේෂ ලැයිස්තුවේ සියළුම ශේෂයන් නිවැරදි වේ.<br>2023 වර්ෂයට අදාලව දෙපාර්තමේන්තුවේ සි.සි.10 ලේඛනයේ සමහර ශේෂ වල දෝෂ සහගත තත්වයන් ඇති බැවින්, කේවල ශේෂ ලැයිස්තුවේ ශේෂ සමග වෙනසක් පෙන්නුම් කරයි. 2024 වර්ෂයේ සිට සි.සි. 10 ණය ශේෂ නිවැරදිව සකස් කිරීමට ක්‍රියා | කේවල ශේෂ ලැයිස්තුවේ ණය ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කරන බව | |
| (ii) | මුදල් රෙගුලාසි 485(4) හා 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 113(6) (ආ) ප්‍රකාරව රජයේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ මාස 03ක් ගත වීමට පෙර නිරවුල් කල යුතු වුවත් ස්ථාන මාරු වී ගිය නමුත් 2023 දෙසැම්බර් 31 දින දක්වා නිරවුල් නොකළ ණය ශේෂය රු.271,683ක් වන අතර එයින් වර්ෂ 05ක් දක්වා නිරවුල් නොකල රු.52,680ක ණය ශේෂයක් ද ඊට ඇතුළත් වී තිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව මාස තුනක් තුළ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (iii) | මියගොස් ඇති සේවකයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4, 4.5, 4.6 වගන්ති අනුව කටයුතු කල යුතු වුවත්, නිලධාරියා මියගොස් වර්ෂ 05කට වඩා කල් ගත වී ඇති රු.342,200ක ණය ශේෂ 4ක් ඇපකරුවන්ගෙන් හෝ උරුමකරුවන්ගෙන් අයකර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂවල මාස 03 සිට අවුරුදු 03 දක්වා කාලච්ඡේදයක සිට පැවත එන එකතුව රු.2,674,976ක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | අවසාන වාරිකය අයකර වර්ෂ 05කට වඩා කල්ගත වී තිබුණු සේවය අත්හැර ගිය නිලධාරියකුගේ අයවිය යුතු රු.171,638ක ණය ශේෂයක්ද , වර්ෂ 4-5ත් අතර කාලයට අයත් රු. 48,654ක ණය ශේෂයක් ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (vi) | වැඩ තහනම් කර ඇති නිලධාරීන් 14 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,075,449ක ණය ශේෂ 2023 දෙසැම්බර් 31 වන විටත් එම ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. වර්ෂ 05 ඉක්ම වූ එකතුව රු.826,069ක ණය ශේෂ 11ක් ද ඊට ඇතුළත් වී තිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (vii) | විශ්‍රාම වැටුප් අත්හිටවූ නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.154,547ක ණය ශේෂය වර්ෂ 05කට වඩා පැරණි වූ අතර වර්ෂ 4-5ත් අතර කාලයට අයත් රු.176,565ක ණය ශේෂයක් ද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | පිළිගනිමි. කඩිනමින් නිරවුල් කර ප්‍රගතිය වාර්තා කරන ලෙස අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයකරුවන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (viii) | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 113 (6) (ආ) යටතේ නිකුත් කර ඇති ඉහත (ඊ) ඡේදය ප්‍රකාරව කල් ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් අනුගමනය කල යුතු ක්‍රියා මාර්ග සැලකිල්ලට ගෙන ස්ථාන මාරු වීම්, මිය යාම්, වැඩ තහනම් කිරීම්, සේවය අතහැර යාම්, විශ්‍රාම වැටුප් අත්හිටු වීම් වැනි හේතුන් මත ණය අයකරගත නොහැකි වූ වසර 05ට වඩා කල් ගත වූ | අදාල ලේඛන යාවත්කාලීන කර විගණනයට ඉදිරිපත් කරන ලෙස වගකිව යුතු නිලධාරීන්ට උපදෙස් දී ඇත. | 2020.08.28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 113 (6) (ආ) පරිදි කල් ගත වූ ණය ශේෂ සම්බන්ධයෙන් වූ |

| | | | |
|---|---|---|---|
| | එකතු වටිනාකම රු.1,547,134ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | ක්‍රියා මාර්ග අනුගමනය කල යුතුය. |
| (ix) | සාමාජික ණය ලේඛනය පවත්වාගෙන යාමේ උපදෙස් අනුව සෑම පඩි ලැයිස්තුවක් සඳහා වෙනම ලේඛනයක් හෝ පිටු කට්ටලයක් හෝ ප්‍රයෝජනයට ගනිමින් පඩි ලැයිස්තුවේ පිළිවෙලට සියළුම සේවකයින්ගේ සාමාජික අංක හා නම් ඇතුලත් කල යුතු නමුත් දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන නිලධාරීන් 31දෙනෙකුගේ ආපදා ණය පිළිබඳ විස්තර සාමාජික ණය ලේඛනයේ (සීසී 10 ආකෘතියේ) ඇතුලත් කර නොතිබුණි. මේ හේතුවෙන් එම නිලධාරීන්ට අදාලව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත වී ඇති රු.5,324,124ක ණය ශේෂයන් හි නිවැරදිතාවය තහවුරු කර ගත නොහැකි විය. | 2023 වර්ෂයේ ගෙවන ලද සියළුම ණය මූලික ලේඛන සමඟ පරීක්ෂා කරන ලදී. ඒ අනුව දැනට සේවය කරන නිලධාරීන් 31දෙනෙකුගේ ආපදා ණය ගෙවීම් විස්තර සි සි 10 ලේඛනයේ අතපසුවීමකින් ඇතුලත් කර නොමැත.2024 වර්ෂය සඳහා සි සි 10 ලේඛන නිවැරදිව සකස් කර ගෙන යනු ලැබේ. | සි සි 10 ලේඛන නිවැරදිව සකස් කර පවත්වාගෙන යා යුතුය. |

**(උ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 272(1) අනුව ගෙවීම් කරන ලද සියලු වවුචර්පත් අංක පිළිවෙලට සකස් කර විගණනයට ඉදිරිපත් කලයුතු වුවත් රු.2,626,173ක් වටිනා වවුචර්පත් 07ක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | විගණනය සඳහා ඉදිරිපත් කර නොමැති මෙම වවුචර් පත්‍ර වෙරහැර කාර්යාලය වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා චෙක්පත් සමග වවුචර එම කාර්යාලයට යැවීම හේතුවෙන් දැනට ප්‍රධාන කාර්යාලයේ නොමැත.මෙම වවුචර්පත් වෙරහැර කාර්යාලයෙන් නැවත ගෙන්වාගෙන ඉදිරිපත් කිරීමට ක්‍රියා කරමි. | මුදල් රෙගුලාසි අනුව ගෙවීම් අවසන් වවුචර් පත් නොපමාව විගණනය වෙත යොමුකල යුතුය. |

**(ඌ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඒසීඒ-එෆ් ආකෘතියේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ දී සමාලෝචිත වර්ෂයට අදාළ අයවැය ප්‍රතිපාදන සම්බන්ධ විස්තර ඇතුළත් කළ යුතු වුවත් එයට අදාළ සංඛ්‍යා ඇතුළත් කර නොතිබූ අතර ඒසීඒ-7 ආකෘතියේ අග්‍රිම සැසඳුම් ප්‍රකාශය තුළ 2023 වර්ෂයට අදාල අග්‍රිම ශේෂය ඇතුලත් විය යුතු නමුත් 2022 ලෙස සඳහන් කර තිබුණි. | 2023 වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේදී අතපසුවීමකින් අයවැය ප්‍රතිපාදන තීරුව සම්පූර්ණ නොකිරීම හා අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ 2023 වෙනුවට 2022 ලෙස මුද්‍රණ දෝෂයකින් ඇතුලත් වී ඇත. | ආකෘතියට අනුකූලව දත්ත ඉදිරිපත් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂය අංක 12-1409 යටතේ විද්‍යුත් රථවාහන දත්ත පද්ධතියක් (ඊ- මෝටරින්) සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.80,000,000ක ප්‍රතිපාදන සලසා දී ඇතත් එකී ප්‍රතිපාදන වලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. | විද්‍යුත් රථ වාහන දත්ත පද්ධතියට අදාල කටයුතු ආරම්භ නොකිරීම හේතුවෙන් එම වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වී තිබේ. | E-Motoring ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර සමුච්චිත බැදීම් හා බැරකම් පිළිබඳ වාර්තාවෙහි (එස්.ඒ.92) රු.221,217,568ක් බැදීම් හා බැරකම් ඇතුළත් වී ඇතත් මුදල් රෙගුලාසි 94 (2) හා (3) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැරකම් පිළිබඳ ප්‍රකාශය තුල බැදීම් හා බැරකම් අගය ලෙස රු.218,115,590ක් ඇතුලත් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල බැදීම් හා බැරකම් රු.3,101,978කින් අඩුවෙන් දක්වා තිබුණි. | සිගාස් පද්ධතියට 2023 වසරට අදාල බැදීම් හා බැරකම් ඇතුලත් කරන අවස්ථාවේදී 2022 වසරට අදාලව දිස්ත්‍රික් කාර්යාල වල පැරණි බැරකම් ශේෂ ගෙවීම් කලද ඉවත් නොකිරීමෙන් ඉතිරි වී ඇති බව හඳුනා ගන්නා ලදි. එබැවින් S A 92 භාණ්ඩාගාර මුද්‍රිත වාර්තාවේ පෙන්නුම් කරන බැදීම් හා බැරකම් අගයට වඩා 2023 මූල්‍ය ප්‍රකාශන තුල බැදීම් හා බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. 2024 වසරේදී සිගාස් පද්ධතියේ ඇතුලත්ව ඇති 2022 ට අදාල පැරණි බැරකම් ඉවත් කර නිවැරදි කර තිබේ. | බැදීම් හා බැරකම්වල නිවැරදි අගයන් SA 92 ආකෘතියේ ඇතුළත් කළ යුතුය. |
| (ii) | පූර්ව ගිණුම් වර්ෂයක් අවසන් දිනට බැදීම් හා බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් වී නොතිබූ පසුගිය වර්ෂයට අදාල රු.54,143,031ක් වියදම් සමාලෝචිත වර්ෂය තුල ගෙවා නිදහස් කර තිබුණි. | අතපසුවීමකින් මෙම බැරකම් Cigas පද්ධතියට ඇතුලත් කිරීමට නොහැකි වී ඇති බව කාරුණිකව දන්වමි. | වර්ෂයට අදාළ සියලුම බැදීම් හා බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතුය. |
| (iii) | 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 02 (ආ) ඡේදය ප්‍රකාරව ඉදිරි වර්ෂ තුල ගෙවීමට ඇති බැදීම් විසර්ජන ගිණුමේ සටහන 03 තුල හෙළිදරව් කළ යුතු වුව ද, 2023 දෙසැම්බර් 31 දිනෙන් පසු ඉදිරියට ගෙවීමට ඉතිරිව ඇති මූල්‍ය කල්බදු වාරික 05ක් වෙනුවෙන් වූ රු.3,751,835 බැදීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියට ගෙවීමට ඇති මූල්‍ය කල්බදු වාරික වටිනාකම අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට නොහැකි වී තිබේ . ඉදිරියේදී එවැනි අතපසුවීම් වැලැක්වීමට ක්‍රියා කරමි. | ගිවිසුම්ගත කල්බදු පිළිබඳ තොරතුරු බැදීම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් රථ පනතේ 203 අධිකාරිය අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත රිය පුහුණුකරුවන් නොමැතිව පුහුණුවන්නෙකුට මෝටර් වාහනයක් තනිව පැදවීම නීතියෙන් තහනම් වේ. එවැනි පසුබිමක් තුල රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත විභාගය සමත් අයදුම් කරුවන් වෙත රිය පුහුණුව සඳහා L පුවරුවක් ලබා දුන්නද එකී L පුවරු භාවිතයෙන් අදාල අයදුම්කරුවන් වෙත මෝටර් රථය ධාවනය පුහුණු වීමට අවකාශය හිමි නොවේ. එහෙත් සියළුම ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් වෙත L පුවරුවක් ලබා දීම හා ලබා දීමට කටයුතු කිරීම හා ඒ සඳහා L පුවරු මිලදී ගැනීම සඳහා රු.162,495,000ක රජයේ මුදල් භාවිතා කිරීමට කටයුතු කර තිබුණි. | රියදුරු බලපත්‍ර ලබා ගැනිමට අපේක්ෂා කරන අයදුම්කරුවකු ලිඛිත විභාගය සමත් වූ පසු ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ආසන්න වශයෙන් මාස 03ක පමණ කාලයක් ලබා දෙනු ලැබේ. මේ කාලය ලබා දෙනු ලබන්නේ අයදුම්කරුට සුදුසුකම් ලත් පුහුණුකරුවකු වෙතින් ප්‍රායෝගික පුහුණුව ලබා ගෙන තනිව වාහනයක් මාර්ගයේ ධාවනය කිරිම සඳහා හැකියාව ලබා ගැනිම සඳහා වේ. මෙවැනි අවස්ථාවලදි ඔවුන් රියදුරු පාසලකට සම්බන්ධ වී අදාල පුහුණුව ලබා ගන්නා අතරම තමන්ගේම වාහනයක ද සුදුසුකම්ලත් පුහුණුකරුවකු සමග පුහුණුවන අවස්ථා ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය සම්මත ප්‍රමිතියකින් යුතු එල් පුවරු මුදල් අයකර මෙම දෙපාරතමේන්තුව මගින් නිකුත් කරනු ලැබේ. එල් පුවරු සඳහා රු. 162,495,000 ක් වැය කලද ගාස්තුවක් අයකර නිකුත් කරන බැවින් අදාල වියදම ආවරණය වන බවද කාරුණිකව දන්වමි. | අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් රාජ්‍ය මුදල් වැයකල යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ දත්ත පද්ධතිය අනුව වර්ෂයක් තුල නිකුත් වන නව රියදුරු බලපත්‍ර සංඛ්‍යාව දළ වශයෙන් 400,000ක් වීම සැලකිල්ලට ගත්කළ මෙම ප්‍රසම්පාදනය භාවිතයෙන් ආසන්න වශයෙන් වර්ෂ 3කදී නිකුත් කල අවසන් කල නොහැකි ප්‍රමාණයක් වන L පුවරු 1,800,000ක් මිලදී ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් අනවශ්‍ය ලෙස අත්‍යවශ්‍ය නොවන කාර්යයක් සඳහා රජයේ මුදල් උපයෝජනය කර තිබුණි. | වාර්ෂික රියදුරු බලපත්‍ර නිකුත් කරන සංඛ්‍යාව 400,000 වුවද, ඒ අනුව L පුවරු අවශ්‍යතාවය තීරණය නොවේ. රියදුරු බලපත්‍ර අයදුම් කරුවන්ගේ සංඛ්‍යාව මත L පුවරු මිල දී ගැනීම තීරණය කරනු ලැබේ. | අවශ්‍යතාවය අනුව වියදම් දැරිය යුතුය. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ප්‍රකාරව වෙළඳපළ මිල සැදැහුම් ක්‍රමය යටතේ රු.මිලියන 10 ඉක්මවන ප්‍රසම්පාදනයන් සඳහා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබාගත යුතු වුවත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කිරීමකින් තොරව රු.මිලියන 12කට අධික වටිනාකමක් සහිත | විමසුමේ සඳහන් රු.මි. 12 ක් වූ ප්‍රසම්පාදනය වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ සිදු කරන ලද ප්‍රසම්පාදනයක් නොවන අතර සීමිත මිල කැඳවුම් ක්‍රමය යටතේ | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් සීමාවන් තුල ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලියාපදිංචි සහතික තැපැල් කරන කවුළු සහිත ලියුම් කවර මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදනය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකර තිබුණි. | සිදු කරන ලද ප්‍රසම්පාදනයකි.. | |
| (ඈ) | වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයීමට අදාල කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මිල නැවත සංශෝධනය | | |
| (i) | වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුමට අන්තර්ගත ලංසු කැඳවීමේ ලියවිලි අතර වූ ලංසුකරුවන්ට ලබා දී ඇති උපදෙස් මාලාවේ පළමු වගන්තියට අනුව අන්තර්ජාතික මිල කැඳවීමේ ක්‍රමයට මිල ගණන් කැඳවන බවත් ලංසු මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්විය යුතු බවත් සඳහන් කර ඇත. ඒ අනුව අන්තර්ජාතික මිල කැඳවීම් මඟින් සැපයුම්කරු තෝරාගෙන ඇති බැවින් හා සාර්ථක ලංසුකරු ජර්මානු සමාගමක්වීම මෙන්ම අදාල ජර්මානු සමාගම වෙනුවෙන් දේශීය නියෝජිත ආයතන ගිවිසුම්ගත වී තිබීම යන කරුණු සැලකීමේදී අන්තර්ජාතික තරගකාරී මිල ගණන් කැඳවීම ක්‍රමයට ලංසු කැඳවා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇති, ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ගිවිසුමක් සඳහා ඩොලරයට ගෙවන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය වෙනස්වීම මත ගිවිසුම්ගත මිල ගණන් සංශෝධනයක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ තුල ප්‍රතිපාදනයන් ඇතුලත් වී නොමැත. ඒ අනුව මෙම මිල සංශෝධනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි බව නිරීක්ෂණය විය. | වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයුම්කාර ආයතනය වන ඇක්සස් ඉන්ටර්නැෂනල් (ප්‍ර) ලිමිටඩ් විසින්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත මිල ගණන් වැඩිකර දෙන ලෙස 2022.06.21 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම සම්බන්ධව, අංක MT/50/2022 දරණ 2022.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ලැබුණු අංක අමප/22/1104/608/010 හා 2022.08.22 දිනැති අනුමැතිය මඟින් තාක්ෂණ ඇගයීම් කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවක් (CANC) පත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් පත් කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිල වැඩිවීම සම්බන්ධව ලබා දී ඇති නිර්දේශ අනුව, අමාත්‍ය මණ්ඩලය මඟින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවේ (CANC) නිර්දේශයන් ඉදිරිපත් කර ඇත. එම නිර්දේශ ඉදිරිපත් කරන ලද අංක MT/123/2022 දරණ 2022.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඒ සඳහා අංක අමප/23/0023/608/002 හා 2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත. එම තීරණය ප්‍රකාරව කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය. . |

| | | | |
|---|---|---|---|
| (ii) | මෙම මිල සංශෝධනය ඉදිරිපත් කිරීමට පෙර වාහන අංක තහඩුවලින් පලාත් අක්ෂර ඉවත්කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වාහන නියාමනය බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් (සංවර්ධන)ගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු 14 දින රාජ්‍ය අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් තිදෙනෙකු හා සැපයුම්කරුගේ දේශීය නියෝජිත ආයතනය වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධ වී ඇති අතර එහිදී ගිවිසුම්ගත අංක තහඩු ප්‍රමාණය ලබා දීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා එම අවස්ථාව වන විටත් ඇණවුම් කර ඇති බවත් පලාත් අක්ෂර ඉවත් කිරීම මඟින් ගිවිසුම්ගත අංක තහඩු ප්‍රමාණය ලබා දීමට නොහැකි වුවහොත් ඔවුන්ට අලාභයක් සිදු වන බවත් සැපයුම්කාර ආයතනයේ නියෝජිතයන් කමිටුව හමුවේ ප්‍රකාශ කල බව කමිටු වාර්තාවේ සඳහන්ව ඇත. ඒ අනුව ගිවිසුම් ප්‍රකාරව ගිවිසුමේ බැදීම් ඉටු කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණයන් මෙම මිල සංශෝධනය ඉල්ලුම් කිරීමට පෙර සැපයුම්කරු විසින් ආනයනය කර ඇති බව තහවුරු වන නමුත් ඒ පිළිබඳ සැලකිල්ලට ගැනීමකින් තොරව මිල සංශෝධනයක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර තිබුණි. | වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයුම්කාර ආයතනය වන ඇක්සස් ඉන්ටර්නැෂනල් (ප්‍ර) ලිමිටඩ් විසින්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත මිල ගණන් වැඩිකර දෙන ලෙස 2022.06.21 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම සම්බන්ධව, අංක MT/50/2022 දරණ 2022.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ලැබුණු අංක අමප/22/1104/608/010 හා 2022.08.22 දිනැති අනුමැතිය මගින් තාක්ෂණ ඇගයීම් කමිටුවක් හා සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවක් (CANC) පත් කර ඇත. අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පත් කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිල වැඩිවීම සම්බන්ධව ලබා දී ඇති තීරණය නිර්දේශ අනුව, අමාත්‍ය මණ්ඩලය මගින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුව (CANC) මිල ගණන් වැඩි වීම සම්බන්ධයෙන් නිර්දේශයන් ඉදිරිපත් කර ඇත. | ප්‍රසම්පාදනයට අදාල වන සියළුම තොරතුරු තීරණ ගැනීමට අදාල කරගත යුතුය. |
| (iii) | අමප/22/1104/608/010 දරණ 2023 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් ව්‍යාපෘති කමිටුවක් පත් කර ඇති අතර 2022 නොවැම්බර් 22 දින උක්ත කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුව (CANC) වෙත ඉදිරිපත් කර තිබුණි. සැපයුම මිල ගණන් තීරණය වන අනෙකුත් කිසිදු කරුණක් පිළිබඳ ඇගයීමකින් තොරව විනිමය අනුපාතයේ වෙනස්වීම පමණක් සැලකිල්ලට ගෙන කමිටු වාර්තාව පිළියෙල කර තිබූ අතර විනිමය අනුපාතයේ වෙනස්වීම මඟින් සැපයුම් අයිතමයේ මිල ගණන් සඳහා වන බලපෑම ගණනය කිරීමකින් හෝ තොරව සැපයුම්කරු සමඟ සාකච්ඡා කර එකඟ වන මිල සංශෝධනයක් ලබා දීමට සුදුසු බව තීරණය කර තිබීම හේතුවෙන් ව්‍යාපෘති කමිටුව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘති කමිටුව පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයෙන් බැහැර කරුණකි. ඒ අනුව මෙම ඡේදය සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ අදාළ අංශය වෙත යොමු කරනු ලැබේ. | වගකීම් දරන නිලධාරීන් සිය රාජකාරි මැනවින් ඉටුකල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | අමප/22/1104/608/010 දරණ 2023 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල මිල සංශෝධන කමිටුව වෙත උක්ත ව්‍යාපෘති කමිටු වාර්තාව ඉදිරිපත් වී තිබුණි. එකී වාර්තාවෙහි මිල වැඩි කිරීම සාධාරණීකරණය කිරීම සඳහා තාත්වික තර්කානුකූල කරුණු ඇතුලත් වී නොතිබිය දී මිල වැඩිවීමක් සඳහා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව හැර වෙනත් කිසිදු අධ්‍යනයක්, ඇගයීමක් පිළිබඳ සඳහනකින් තොරව සැපයුම්කරු සමඟ එකඟවූ අගයක් ලෙස, පදනම් විරහිතව සියයට 62.5 ක මිල වැඩිවීමක යෝජනාවක් ඇතුලත්ව 2022 නොවැම්බර් 29 දිනැති කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබීම හේතුවෙන් මිල සංශෝධන කමිටුව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය. | -එම-. | වගකීම් දරන නිලධාරීන් සිය රාජකාරි මැනවින් ඉටුකල යුතුය. |
| (v) | අංක MT/123/2022 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණයන්ට අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.5 වගන්තිය අනුව මිල ගණන් වැඩි කිරීමට හැකියාවක් ඇත්දැයි නීතිපති විමසා උපදෙස් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව මිල සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගිවිසුම් කොන්දේසි අංක 30 අනුකූලව ගිවිසුමේ නෛතික ප්‍රතිපාදන පවතින්නේද යන්න 2023 පෙබරවාරි 09 දින අංක DMT/11/DE/02 දරණ ලිපිය මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නීතිපති විමසා තිබූ අතර "මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයේ අඩංගු කරුණු", ගිවිසුමේ 30 වගන්තියට ඇතුලත් විෂය පථයට අයත් නොවන බව නීතිපති විසින් පෙන්වා දී තිබුණි. එහෙත් නීතිපති මතය අදාල කර ගැනීමකින් තොරව මිල සංශෝධනයක් සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් වගන්ති සංශෝධනය කර සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස සංශෝධිත කොන්දේසි ඇතුලත් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර තිබුණි. | අංක MT/50/2022 දරණ 2022.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.5 හි සඳහන් පරිදි මිල ගණන් වැඩි කිරීමට හැකියාවක් ඇතිද යන්න පිළිබඳව අංක DMT/H/DE/04/02 හා 2023.02.09 දිනැති ලිපිය මගින් ගරු නීතිපතිතුමාගේ මතය විමසන ලදුව, අංක CL/34/2023 හා 2023.04.19 දිනැති ලිපිය මඟින් ගරු නීතිපතිතුමාගේ මතය ලබා දී ඇත. ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ මතය අංක DMT/H/DE/04/02/05 හා 2023.07.17 දිනැති ලිපිය මඟින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ඉල්ලීම අනුව 2023.08.03 දින මහා මාර්ග අමාත්‍යාංශයේ දී රැස්වීමක් පවත්වන ලදී. එම රැස්වීමේ දී ලැබුණු උපදෙස් අනුව ගිවිසුමේ කෙටුම්පත පිළිබඳව නිර්දේශ ලබා දී ඇත. | අමාත්‍ය මණ්ඩලය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කල යුතුය. |

**3.2** **පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමප/16/1307/709/061 හා 2016 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයනය කරන ලද යතුරුපැදි ඉන්ධන ධාරිතාවය පදනම් කර ගනිමින් අධිභාරයක් අය කිරීමකට යටත්ව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එන්ජින් ධාරිතාවය 201 – 250CC කාණ්ඩයේ යතුරුපැදි සඳහා අය කල යුතු අධිභාරය රු.200,000ක් වුවත් ඊට අනුකූල නොවන සේ රු.50,000 සිට රු.65,000 දක්වා වූ ගාස්තුවක් පමණක් අයකර යතුරුපැදි 55ක් ලියාපදිංචි කර තිබීම හේතුවෙන් රජයට ලැබිය යුතු රු.8,080,000ක ආදායමක් අහිමි කර තිබුණි. | මෙ සම්බන්ධයෙන් ඔබගේ නිරීක්ෂණ බැහැර නොකරන නමුත් විශේෂ කාර්යයක දී ගෙවීම් සිදු කිරීම සඳහා “ විවිධ ගෙවීම් ” (Miscellaneous) ක්‍රමවේදය භාවිතා කිරීමට පරිගණක පද්ධතිය තුල හැකියාවක් ඇති බැවින් සහ මෙම කාර්යය සඳහා වූ අයකිරීම් ද එම ක්‍රමවේදය අනුව සිදු කිරීමේ හැකියාව ඇති අතර , එහිදී යොමු අංකයන් පැහැදිලිව සඳහන් කර නොමැති අවස්ථාවක එය හඳුනා ගැනීමට පරිගණක පද්ධතිය තුල හැකියාවක් නොමැති අතර, එමගින් සඳහන් කර ඇති යතුරුපැදි සඳහා අයකල මුදල නිශ්චිතව හඳුනාගත නොහැක. කෙසේ වෙතත් “ විවිධ ගෙවීම් ” Miscellaneous) ක්‍රමවේදය යටතේ මෙම කාණ්ඩවල යතුරු පැදි සඳහා අයකිරීම් කිහිපයක් හඳුනා ගෙන පරිගණක පද්ධතිය මඟින් ලබා ගැනීමට හැකි වූ අතර, ඒ අනුව එම අයකිරීම් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අනුමත ගාස්තු වන බව නිරීක්ෂණය විය. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |
| (ii) | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එන්ජින් ධාරිතාවය 251 – 450CC කාණ්ඩයේ යතුරුපැදි සඳහා අයකල යුතු අධිභාරය රු.350,000ක් ලෙස අමාත්‍ය මණ්ඩල තීරණය තුල ඇතුලත් වී ඇතත් ඊට අනුකූල නොවන සේ රු.50,000 සිට රු.300,000 දක්වා වූ ගාස්තුවක් පමණක් අයකර යතුරුපැදි 241ක් ලියාපදිංචි කර තිබීම හේතුවෙන් රජයට ලැබිය යුතු රු.70,070,000ක ආදායමක් අහිමි කර තිබුණි. | -එම- | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජනතාව වෙත උක්ත සහනය පිළිබඳ මාධ්‍ය ප්‍රකාශය නිකුත් කල 2016 අගෝස්තු 30 දින සිට මාස 04ක සහන කාලයක් ඇතුලත ලියාපදිංචි කිරීම අවසන්කල යුතු වුවත් එකී අවසන් කල යුතු දිනය වන 2016 දෙසැම්බර් 30 සිට ඉදිරි මාස 05ක කාලයක් කැබිනට් අනුමැතියකින් තොරව හා ලියාපදිංචි කිරීමට අවශ්‍ය නීතිමය ලිපිලේඛන නොමැතිව යතුරුපැදි 3088ක් ලියාපදිංචි කර තිබුණි. | පිළිගනිමි. මෙම ලියාපදිංචි කිරීම් 2016 වර්ෂයේ සිදුකර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් දැනට ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් සොයා බලන ලෙස අදාල නිලධාරින් දැනුවත් කරන අතර ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීමට නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කරමි. | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |
| (ආ) | වේරහැර ආපන ශාලාවේ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ප්‍රසම්පාදන කමිටු තීරණයකට අනුව 2019-2020 වසරක කාලයක් සඳහා මාසිකව රු.391,000කට වේරහැර ආපනශාලාව බද්දට දී තිබූ අතර 2021 මාර්තු 31 දින දක්වා බදුකරු විසින් ආපනශාලාව පවත්වාගෙන ගොස් තිබුණි. බදුකරුගෙන් රු.2,964,400ක හිඟ බදු මුදල් අයකරගත යුතුව තිබියදී රු.1,173,000ක කාර්යසාධන ඇපකරය ඔහු වෙත නිදහස් කිරීමට කටයුතු කර තිබූ අතර රු.මිලියන 3කට ආසන්න හිඟ බදු කුලියක් එකතුවන සේ බදු මුදල් අයකර ගැනීමකින් තොරව ආපනශාලාව පවත්වාගෙන යාමට අවස්ථාව ලබාදීම හා හිඟ බදු කුලී පැවතියදී කාර්යසාධන ඇපකරය නිදහස් කිරීමට පාදක කරගත් නෛතික ලියවිලි කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර හා නාරාහේන්පිට පරිශ්‍රයන්හි පිහිටුවා ඇති බාහිර ආයතනයන් වෙතින් කුලී / බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් එක් එක් ඡේදයෙන් මතුකර ඇති බදු මුදල් එකතු කිරීම, ගිණුම්ගත කිරීම හා හිඟ ආදායම් සම්බන්ධයෙන් ඔබ විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ හා එකඟ වෙමි. ඒ අනුව මෙම බදු / කුලී මුදල් විධිමත් පරිදි අයකර ගැනීම හා රජයේ ආදායමට ගිණුම්ගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |
| (ii) | උක්ත ආපන ශාලාව නැවතත් 2021 සිට 2023 දක්වා කාලය තුල රු.261,000ක මාසික බදු කුලියක් මත වෙනත් පුද්ගලයෙකු වෙත බදු දී තිබූ අතර හිඟ කුලී ආදායම රු.3,132,000ක් දක්වා සමුච්චිත වන තෙක් ආපනශාලාව පවත්වාගෙන යාමට විෂයභාර නිලධාරින් අවස්ථාව ලබා දී තිබුණි. කාර්යසාධන ඇපකරය හා වරින්වර අයකරගත් මුදල්ද ඇතුළුව හිඟ ආදායම රු.1,133,000ක් දක්වා බදුකරුගෙන් මුදල් අයකර ගෙන තිබූ නමුත් උක්ත හිඟ ආදායම අයකර ගැනීමකින් තොරව ආපනශාලාව තුල පැවති බදුකරුගේ දේපල ඉවත්කර ගැනීමට අවස්ථාව ලබා දී තිබුණි. | -එම- | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |
| (iii) | වේරහැර ආපනශාලාව බදු දී ඇති පසුගිය අවස්ථා තුන සැලකිල්ලට ගත්විට රු.327,000, රු.341,000 හා රු.236,000 බැගින් මාසික කුලී පදනම් මත කුලියට දී තිබුණි. මේ අනුව වේරහැර ආපනශාලාව සඳහා මාසිකව රු.300,000ක බදුකුලී ආදායමක් ලැබිය හැකි අතර වර්ෂයක් සඳහා කුලී ආදායම රු.3,600,000ක් වේ. කෙසේ නමුත් කිසිදු කුලී මුදලක් අය කිරීමකින් | -එම- | නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් බදුකරු තෝරාගත යුතු අතර කඩිනමින් තක්සේරු වාර්තාවක් කැඳවා සුභ සාධන සංගමයෙන් සාධාරණ බදු කුලියක් |

| | | | |
|---|---|---|---|
| | තොරව මෙම ආපනශාලාව 2023 මාර්තු මස සිට සුහසාධන සංගමයක් වෙත ලබා දී තිබීම හේතුවෙන් රු.3,000,000ක වාර්ෂික කුලී ආදායමක් රජයට ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | | අයකල යුතුය. |
| (ඇ) | ප්‍රධාන කාර්යාලයේ හා වේරහැර පරිශ්‍රයේ ස්ථාපිත කර ඇති ආපනශාලා හැර අනෙකුත් ආයතන වෙතින් පසුගිය වසර 5ක කාලය තුල රු.2,507,600ක හිඟ ආදායමක් ලබා ගත යුතුව ඇතත් එකී ආදායම් අය කර ගැනීමට හෝ හිඟ ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය. |

**3.3 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

දෙපාර්තමේන්තුව වෙත නිකුත් කරන ලද පහත විස්තර සඳහන් විගණන විමසුම් සඳහා 2024 මැයි 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන විමසුම පිළිබඳ විස්තරය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලියාපදිංචි සහතිකයක වැසි අංකය හා වෙනත් දත්ත සංශෝධනය සම්බන්ධයෙන් 2022/2023 වර්ෂයේ ලැබී ඇති අයදුම්පත් හා ඊට අදාලව සිදු කර තිබූ සංශෝධනයන් පිළිබඳ විගණන පරීක්ෂාව | විගණන විමසුම් 03 සඳහා කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස නිළධාරීන් දැනුවත් කර ඇත. | මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීය යුතුය. |
| (ආ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු මාතර ශාඛාවේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳ විගණන පරීක්ෂාව | -එම- | -එම- |
| (ඇ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර හා නාරාහේන්පිට පරිශ්‍රයේ ස්ථාපිත වෙනත් ආයතන වෙතින් බදු මුදල් අයකර ගැනීම පිළිබඳ පරීක්ෂාව | -එම- | -එම- |

**3.4 කළමනාකරණ දූර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෝටර් වාහන පනතේ (203 අධිකාරිය) XII වන කොටසෙහි අඩංගු පරිපූරක විධි විධාන අංක 231 අනුව මෙම පනත හෝ යම් නියෝගයක් යටතේ දෙන ලද සහතිකයක් අවසර පත්‍රයක් අස්ථානගත වූ විට හෝ විනාශ වූ විට, නිකුත් කල බලධාරියා සෑහීමකට පත්වන තොරතුරු ඔප්පු කලහොත් එකී අවසර පත්‍රයේ හෝ සහතික පත්‍රයේ අනුපිටපතක් ලබා දිය යුතුය. එහෙත් ඊට අනුකූල නොවන සේ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයන්හි දෙවන පිටපත නිකුත් කර වසර 5 සිට වසර 25ක් දක්වා වූ කාලයකට පසුව, 2023 වර්ෂයේ අවස්ථා 19ක දී දිවුරුම් ප්‍රකාශයක් මඟින් සිදු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාරීව පෙර වර්ෂයන්හි නිකුත් කරන ලද මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයන්හි දෙවන පිටපත වෙනුවට මෝටර් රථ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත නිකුත්කර තිබුණි. | මෝටර් වාහන පනතේ ප්‍රතිපාදන අනුව මෝටර් වාහනයක මුල් ලියාපදිංචි සහතිකය විනාශ වූ හෝ අස්ථානගතවීමකට අනතුරුව නිකුත් කලයුතු වන්නේ අනුපිටපතක් බව ඔබගේ පෙන්වා දීම හා මම ද එකඟ වෙමි.<br>එසේ වුවත් පසුගිය වසර ගණනාව තුල මුල් පිටපත වෙනුවට අනුපිටපත් නිකුත් කිරීම මඟින් විවිධ අපහසුතාවයන්ට සහ මෝටර් රථය විකුණා ගැනීමේ දී විවිධ දුෂ්කරතාවයන්ට මෙන්ම අලාභ තත්ත්වයන්ට මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිකරුවන්ට මුහුණ දීමට සිදුවන බවට මා වෙත මෙන්ම මට පෙර පත්වූ කොමසාරිස් | පවතින නෛතික විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ජනරාල්වරු වෙත ද විවිධ මහජන දුක්ගැනවිලි ලැබී තිබේ. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙතද මේ සම්බන්ධව ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීම් මා වෙත යොමු කල අවස්ථා ද තිබේ. ඒ අනුව දෙවන පිටපත අනුපිටපතක් (Duplicate) ලෙස නිකුත් නොකරන ලෙස ඉල්ලා සමාජය තුල කතිකාවක් නිර්මාණය වී ඇති බව මා වෙත ද නිරීක්ෂණය විය. ඒ අනුව Duplicate යන්න ඉවත් කිරීමට ඇති හැකියාව සොයා බැලීමට දෙපාර්තමේන්තුවේ කමිටුවක් පත්කර කරුණු ද අධ්‍යනය කර තිබේ.<br>ඒ අනුව ඉදිරියේදී සියලු පුරවැසියන් වෙත අදාල මුල්පිටපත අස්තානගතවීම හෝ විනාශවීම මත නව පිටපතක් ඉල්ලීමේදී අනුපිටපතක් යන්න සහතිකයේ සදහන් කිරීමකින් තොරව නිකුත් කිරීමට අදාල නෛතික ප්‍රතිපාදන සැලසීමට කටයුතු ආරම්භ කර ඇත. | |
| (ආ) | වාහන ලියාපදිංචි සහතිකයේ දෙවන පිටපත වෙනුවෙන් මුල් පිටපත් නිකුත් කර ඇති වාහන 06කට අදාලව විගණන විසින් සිදුකල පරීක්ෂාවේ දී එම ලියාපදංචි සහතික පිටපත් ලබා ගැනීම උදෙසා ඉදිරිපත් කර තිබූ දිව්රුම් ප්‍රකාශ 03ක් එකම අත් අකුරු හා එකම ආකෘතියක් වීමත්, අනෙක් දිව්රුම් ප්‍රකාශ 03 එක සමාන ආකෘතියකින් ඉදිරිපත් කරතිබීමත් හා දෙවන පිටපතක් මුල් පිටපතක් බවට පරිවර්තනය කිරීමට ප්‍රතිපාදන ඇතුලත් නොවීමත්, එවැනි හඳුන්වාදීමක් සිදු කරන්නේ නම් ඕනෑම පුද්ගලයකුට දෙවන පිටපත ඉදිරිපත් කර මුල් පිටපත ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු වීමත්, සීමිත පිරිසකට මෙම අවස්ථාව ලබා දීමෙන් අනෙකුත් දෙවන පිටපත් ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ මානව හිමිකම් අභියෝගයට ලක් වීමත්, වෙනත් රාජ්‍ය ආයතන නිකුත් කරනු ලබන මෙහා සමාන සහතික හෝ බලපත්‍ර දෙවන පිටපත වෙනුවට මුල් පිටපත් නිකුත් නොකිරීමත් යන කරුණු හේතුවෙන් මෙලෙස දෙවන පිටපත් වෙනුවට මුල් පිටපත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය රටේ මූලික නීතීන්ට අනුව නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය විය. | දැනට ක්‍රියාත්මක මෝටර් වාහන පනත අනුව මුල් පිටපතක් බවට පරිවර්ථනය සඳහා වන වගන්ති කිසිවක් නැති බව පිළිගනිමි. පනතෙහි සදහන් වන්නේ සහතිකය, අවසරපත්‍රය හෝ බලපත්‍රය නැති වූ බව, විනාශ වූ බව, විකෘති වූ බව හෝ පලුදු වූ බව තමා සෑහීමකට පත්වන පරිදි ඔප්පු කරනු ලැබූවිට අදාල තැනැත්තා වෙත අනුපිටපතක් නිකුත් යුතුය යන්න වේ.<br>මෙම අවකාශය සීමිත පිරිසකට පමණක් ලබා නොදිය යුතු බවත් මෙම අවස්ථාව සියළු මහජනතාවටම එක හා සමානව භුක්ති විදීමට අවස්ථාව ලබාදිය යුතු බවට ඔබගේ පෙන්වාදීම රටේ මූලික නීතියට අනුකූලවම එසේ වියයුතු බැවින් එකඟ වෙමි. | පවතින නෛතික විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ලියාපදිංචි අංක 32- XXXX දරණ වාහනය දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් නැවත පසුගිය වසර 20ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට 2023 ජූලි 07 හෝ ඊට ආසන්න දිනයක දී කුරුණෑගල පලාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත මෝටර් රථ කොමසාරිස් විමර්ෂණගේ නිල මුද්‍රාව සහිත කූඨ ලේඛණයක් සකස් කර ඉදිරිපත් කර ඇතත් එකී කූඨ ලේඛණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරිම සඳහා කොමසාරිස් (විමර්ශන) වෙත උපදෙස් දිමට කටයුතු කරමි. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ලියාපදිංචි අංක CAW-XXXX දරණ මෝටර් රථය එහි ලියාපදිංචි හිමිකරු විසින් 2022 අප්‍රේල් 21 දින කොහුවල, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙකු වෙත විකුණා තිබූ අතර සියළුම නීත්‍යානුකූල ලියවිලි ඔහු වෙත භාර දී තිබුණි. වාහනය මිලදී ගත් තැනැත්තා මෙම වාහනය නැවත විකිණීම සඳහා කොහුවල ප්‍රදේශයේ ඔහුට අයත් වාහන අලෙවි කරන ස්ථානයක රඳවා තිබියදී මාලඹේ පාර, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් විසින් මෙම වාහනය සඳහා අනීතිකව දෙවන පිටපත් ලබාගෙන පසුව වාහනය ලියාපදිංචි සහතිකයේ දෙවන පිටපත මුල් පිටපතක් බවට පරිවර්තනය කර ගනිමින් කූඨ ලෙස සකසන ලද ලියවිලි සමඟ කල්බදු සමාගමකින් මූල්‍ය පහසුකමක් ලබා ගෙන තිබූ නමුත් කූඨ ලේඛණ සකස් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු සිදුකර නොතිබුණි. | මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරිම සඳහා කොමසාරිස් (විමර්ශන) වෙත උපදෙස් දිමට කටයුතු කරමි. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට තීරු බදු රහිතව ආනයනය කර ලියාපදිංචි අංක KA-XXXX දරණ ලියාපදිංචිය සහිත ජීප් රථයක් 2011 වර්ෂයේ දී ඩුබායි රාජ්‍ය වෙත ප්‍රතිඅපනයනය කිරීම හේතුවෙන් ලියාපදිංචිය අවලංගු කර තිබුණි. එහෙත් එකී අවලංගු කරන ලද අංකය භාවිතයෙන් ජා ඇල ප්‍රදේශයේ පුද්ගලයෙකු වෙත වෙනත් වාහනයක චැසි අංකය හා එන්ජින් අංකය ඇතුලත් කොට මෝටර් වාහනය ලියාපදිංචි කර වලංගු ලියාපදිංචි සහතිකයක් නිකුත් කර තිබූ නමුත් ඒ පිලිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර වංචනිකව කටයුතු කල පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මෝටර් වාහන පනතේ 203 අධිකාරිය අනුව මෝටර් රථයක්, යතුරුපැදියක් හෝ පනත යටතේ ලියාපදිංචි කරනු ලබන යම් වාහනයක වෙනස් කල නොහැකි ප්‍රධාන අංගයක් ලෙස වාහනයේ චැසිය හඳුනාගන්නා අතර වාහනයේ ලියාපදිංචිය චැසි අංකය හා බද්ධව පවතී. මේ අනුව ලියාපදිංචි මෝටර් රථයක චැසිය වෙනස් කර පූර්ව ලියාපදිංචිය පවත්වාගෙන යා නොහැකි වුවත් | පිළිගනිමි. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විධිමත් වලංගු තාර්කික හේතුවකින් තොරව 2022 හා 2023 වර්ෂයන් හීදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක 237කට අදාළ වැසි අංක වෙනස් කර පූර්ව ලියාපදිංචිය පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දී තිබුණි. වැසි අංක වෙනස් කරන ලද උක්ත වාහනයන් පූර්ව වැසි අංකය යටතේ වසර ගණනාවක් ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබීම, එකී වාහනවල නීත්‍යානුකූල හිමිකම අවස්ථා 5කට වඩා වැඩි අවස්ථා ගණනක හුවමාරු වී තිබීම, ඇතැම් වාහන සඳහා මෝටර් රථ පරීක්ෂකවරුන් වෙතින් ලබාගත් බර සහතිකයේ අඩංගු දත්ත වෙනුවට වෙනත් දත්ත ඇතුලත් කර තිබීම යන කරුණු සැලකිල්ලට ගැනීමේදී උක්ත දත්ත සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය දැඩි ලෙස අභියෝගයට ලක්වන නමුත් ඒ පිලිබඳව පරීක්ෂණයක් සිදුකර නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | | |
| (උ) | රජයේ ගිණුම් පිලිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ශ්‍රී ලංකා රේගුවේ නිශ්කාෂණය නොවූ වාහන 07ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා ඊට අදාල ලිපිගොනු අස්ථානගත කර වංචාවක් සිදු කිරීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි 23 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා තීරණය අනුව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් අදාල නිලධාරීන්ට චෝදනා පත්‍ර සකස් කර ඉදිරිපත් කල යුතු වුවත් චූදිත නිලධාරීන්ට එරෙහිව ගත් විනයානුකූල කටයුතු, ලිපිගොනු හෝ කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙම මෝටර් වාහන වලට අදාලව රේගු ගාස්තු ගෙවා ඇති ද යන්න ශ්‍රී ලංකා රේගුවෙන් විමසීමක් කරන ලදි. අදාල බදු ගාස්තු අයවී නොමැති බවට ශ්‍රී ලංකා රේගුවේ CUS/MV/RMV/02/2003 හා 2023.10.24 දිනැති ලිපිය මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. මෙම මෝටර් වාහන පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සඳහා විස්තර රේගුව වෙත යොමු කර ඇත. තවද, මෙම කරුණු විමර්ශනයට හා එයට සම්බන්ධ වගකිවයුතු නිලධාරීන් හදුනාගෙන වාර්තා කිරීම සඳහා මාවිසින් මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. එහි අතුරු වාර්තාව මේ වන විට ලැබී ඇති අතර, එහි සදහන් කරුණු ද අවසන් වාර්තාව ඉදිරිපත් කල පසු එමඟින් හඳුනාගෙන ඇති වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | රජයේ ගිණුම් පිලිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |
| (ii) | ලියාපදිංචි අංක තහඩු නැවත ලබාගෙන එකී වාහන මහා මාර්ගයේ ධාවනය වීම වැලැක්වීමට, එකී වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට, පැවරිය නොහැකි ලෙස විරෝධතා ගොනු කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම්කාරක සභාවේ විමසුමට ලක් වූ උක්ත වාහන 07ක් සම්බන්ධයෙන් පැවරුම් | දැනට මෙම වාහන පැවරීමට නොහැකිවන පරිදි විරෝධතා ගොනුකර ඇත. එමෙන්ම ඉහත (i) ඡේදයේ සඳහන් කමිටුවේ වාර්තාවේ නිර්දේශ සඳහන් කර ගෙන අදාල වාහනවල ලියාපදිංචිය අවලංගු | රජයේ ගිණුම් පිලිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තහනමක් ලබාදී තිබියදී හා ආයතනික මට්ටමින් පරීක්ෂණයක් සිදුකර තිබෙන අතරතුර ඉන් එක් වාහනයක් 2021 අප්‍රේල් 04 දින වෙනත් අයෙකු වෙත පැවරීමට කටයුතු කර තිබූ අතර ගිණුම්කාරක සභා නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඌ) | නීත්‍යානුකූල රේගු බදු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව මගින් නිෂ්කාශනය නොකරන ලද හා වංචනිකව ආනයනය කරන ලද සුඛෝපභෝගී මෝටර් රථ 02ක් හා යතුරු පැදි 04ක් රේගු දෙපාර්තමේන්තුව තුල මෙතෙක් නිෂ්කාශනය නොවූ බහාලුමකට හා අදාල අංක CBHQ I 498224 දරණ සම්පූර්ණයෙන් නිෂ්කාශනය නොවූ රේගු සටහන්කරය භාවිතයෙන් කූඨ ලේඛණ ඉදිරිපත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර උක්ත අනීතික ලියාපදිංචි කිරීම අවලංගු කර නියමිත රේගු බදු අයකර ගැනීමට හා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් විමර්ෂණය කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වය ඇතිව කමිටුවක් මගින් විමර්ශණය සිදු කරන අතර එහි අතුරු වාර්තාවක් මේ වන විට මා වෙත ඉදිරිපත් කර ඇත. එහි අවසන් වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ ලද පසු මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග ඉදිරියේදී රජයේ විගණන අධිකාරී වෙත වාර්ථා කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ) | ඊ මෝටරින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ගිවිසුම්ගත සේවා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සංදේශය හා ඊට අදාලව අමාත්‍ය මණ්ඩලය පත්කල නිලධාරි කමිටු වාර්තාව සඳහා ලබා දී ඇති අංක අමප 23/0952/608/011-1 හා 2023 ජුනි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුලත් 3(1) හා 3(2) යෝජනා සම්බන්ධයෙන් සිදුකල යුතු කාර්යයන් අවසන් කිරීමකින් තොරව ගිවිසුම්ගත සැපයුම්කරු සමඟ ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නේද, ඊට නීතිමය බාධා පවතින්නේද, එසේ කටයුතු කරන්නේ නම් එක් ගනුදෙනුවක් සඳහා ගෙවන ගාස්තුව කොපමණද යන්න පිලිබඳව නිශ්චිත එකඟතාවයකින් තොරව ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගංගාරාම විහාරස්ථානයේ වර්ග අඩියක් රු.98ක් බැගින් වර්ග අඩි 10,000ක් කුලියට ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් සිදු කර තිබුණි. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දන්වා ඇත. | මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා අනෙකුත් කටයුතු සාකච්ඡා මට්ටමේ පවතින අතර අදාල ගොඩනැගිල්ල කුලියට ගැනිම පිළිබඳව මෙතෙක් අවසන් තීරණයක් ගෙන නැත. | ගිවිසුම්ගත සැපයුම්කරු සමඟ ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙතින් නිසි අනුමැතියක් ලබාගත යුතුය. |
| (ii) | ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේදී මෙට්‍රොපොලිටන් ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර ගිවිසුම අනුව එක් ලිපිගොනුවක් සඳහා රු.187.97ක් වන නමුත් වර්තමානය වන විට එක් ලිපිගොනුවකට ගෙවනු ලබන 187.97ට අමතරව තවත් රු. 646ක් බැගින් | ඊ මොටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා එක් ගොනුවකට රු. 187.97 ට අමතරව, ගොඩනැගිල්ලේ අනෙකුත් යටිතල පහසුකම් නිර්මාණය කිරිම සඳහා යන වියදම මෙතෙක් ඇස්තමේන්තු කර | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (මාසයකට ලියාපදිංචි 60000ක් ලෙස සලකා වසර 5ක් වෙනුවෙන්) රු.2,325,600,000ක් (646 x 60000 x 12 x 5) ගෙවා ගිවිසුම්ගත ආයතනය සමග කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු වන නමුත් එකී තීරණය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දන්වා ඇත. | නොමැත. | |
| (ඒ) | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු මාතර ශාඛාවේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සාමාන්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා සමත් විය යුතු ලිඛිත පරීක්ෂණයන් සඳහා ලැයිස්තුගත නොවූ අයදුම්කරුවන් 18දෙනෙකු හා ලිඛිත පරීක්ෂණ දිනයේදී සහභාගී නොවීම හේතුවෙන් පරීක්ෂණ සටහන් ලේඛනයෙහි පැමිණ නොසිටි ලෙස සටහන් වූ අයදුම්කරුවකු ලිඛිත පරීක්ෂණය සමත් බවට ව්‍යාජ ප්‍රතිඵල ඇතුලත් කර හා ලිඛිත පරීක්ෂණයේදී කිසිදු ලකුණක් ලබා නොගත් අයදුම්කරු විභාගය සමත් බවට ව්‍යාජ ප්‍රතිඵලයක් ඇතුලත් කර හා ලේඛන යාවත්කාලීන කර ප්‍රායෝගික පරීක්ෂණයන්ට යොමු වීමට හා ප්‍රායෝගික පරීක්ෂණ අවසානයේ වලංගු රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. | උක්ත නිරීක්ෂණ හා එකඟ වෙමි. මාතර කාර්යාලයේ ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක හරහා මේ පිළිබඳ විමර්ශණයක් සිදු කරන ලද අතර, සැක සහිත සහ විගණනයෙන් පෙන්වා දෙන කරුණුවලට අදාල වූ සියලු ගොනු ඔවුන් විසින් පරීක්ෂා කර ඇත. ඒ අනුව අදාල අක්‍රමිකතාවලට සම්බන්ධ කාර්යාලීය නිලධාරිණියකගේ සේවය අත්හිටුවා ඇත. මේ පිළිබඳ විමර්ශණ තවදුරටත් සිදු කෙරෙමින් පවතී. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | රියදුරු බලපත්‍ර ලබා දීම සඳහා සමත් විය යුතු ප්‍රායෝගික පරීක්ෂණයන්ට ලැයිස්තුගත නොවූ අයදුම්කරුවන් 10දෙනෙකු හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම හේතුවෙන් ප්‍රතිඵල ලේඛනයෙහි පෙනී නොසිටි ලෙස සටහන් වී ඇති එක් අයදුම්කරුවකු, ප්‍රායෝගික පරීක්ෂණ ලේඛනයෙහි අදාල පරීක්ෂණ අසමත් බවට තොරතුරු ඇතුලත් වී ඇති එක් අයදුම්කරුවකු, හා ප්‍රායෝගික ලේඛණයන්හි කිසිදු සටහනක් ඇතුලත් නොවූ අයදුම්කරුවන් පස්දෙනෙක් වෙනුවෙන් ප්‍රායෝගික පරීක්ෂණ සමත් බවට ව්‍යාජ දත්ත ඇතුලත් කර වලංගු රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි. | -එම- | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන ලිඛිත පරීක්ෂණයක් සඳහා පෙනී නොසිට එහෙත් ලිඛිත පරීක්ෂණ පැවැත්වූ දිනයකදී එදින භාවිතා නොවූ විභාග අංකයන් හා ව්‍යාජ ප්‍රතිඵලයක් ඇතුලත් කර එක් අයදුම්කරුවකුට වලංගු රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබූ අතර ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන පරීක්ෂණ ද්විත්වයට පෙනී නොසිටියදී එකී පරීක්ෂණයන් සමත් බවට ව්‍යාජ තොරතුරු | -එම- | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුලත් කර රියදුරු බලපත්‍ර ලබා දීමට අවස්ථාව ලබා දී තිබුණි. | | |
| (ඔ) | යුධ හමුදාව විසින් අපහරණය කරන ලද වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | මෝටර් රථ පනතේ 203 අධිකාරිය ප්‍රකාරව වාහන නව ලියාපදිංචි කිරීමක් සඳහා MT–02 පෝරමය සමඟ වාහනය රේගුවෙන් නිදහස් කිරීමේදී නිකුත් කරන ලද ලියවිලි, රේගු ගාස්තු ගෙවූ රිසිට්පතේ මුල් පිටපත හා අලුතින් නිපදවන ලද මෝටර් රථයක් නම් අදාල ඉන්වොයිසිය වැනි වාහනයට අදාල මූලික ලියවිලි ඉදිරිපත් කල යුතු වේ. විශේෂිත ආයතනවලට හෝ විශේෂිත පුද්ගලයින් වෙත උක්ත ලියවිලිවලින් තොරව වාහන නව ලියාපදිංචි කිරීමක් සඳහා මෝටර් වාහන පනතේ 203 අධිකාරිය තුල ප්‍රතිපාදන ඇතුළත් වී නොමැත. එහෙත් පූර්ව ලියාපදිංචියකින් තොරව ත්‍රිවිධ හමුදාව භාවිතා කර ටෙන්ඩර් ක්‍රියාවලියකින් පසුව සිවිල් පුද්ගලයින් වෙත අලෙවි කර ඇති වාහන 63ක් මෝටර් රථ පනතේ 203 අධිකාරියට අනුකූල නොවන සේ උක්ත මූලික ලියවිලිවලින් තොරව අංක කාණ්ඩ 325 යටතේ ලියාපදිංචි කර අදාල සිවිල් පුද්ගලයින් වෙත පවරා දී තිබුණි. | ත්‍රිවිධ හමුදාවට අයත් මෝටර් වාහන මහා මාර්ගයේ ධාවනය සඳහා ත්‍රිවිධ හමුදාවන්ට අනන්‍ය වූ කාණ්ඩ අංකයක් සමඟ අංකයක් භාවිතා කිරීමට මෝටර් වාහන පනතේ 238 වන වගන්තිය අනුව ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව පොදුවේ මෙරට තුල භාවිතා කරන වාහන ලියාපදංචිය සඳහා විධිවිධාන මෝටර් රථ පනතේ 203 අධිකාරිය ප්‍රකාරව සලසා තිබුණ ද විශේෂිත ආයතන වලට (ත්‍රිවිධ හමුදා) සහ විශේෂිත පුද්ගලයන් (ජනාධිපති, අගමැති) සඳහා ඉහත විධිවිධානයනගෙන් පරිභාහිරව මෝටර් රථ පනතේ 238 අධිකාරිය ප්‍රකාරව ප්‍රතිපාදන යොදා ගෙන මෝටර් රථ ලියාපදිංචි කර භාවිතා කිරීමේ හැකියාව ඇත.<br>ඒ අනුව ත්‍රිවිධ හමුදාව මගින් අලෙවිකරණ වාහන සිවිල් පුද්ගලයන් අතට පත් වූ විට එම වාහන මෝටර් වාහන පනතේ 203 අධිකාරිය ප්‍රකාරව වාහන නව ලියාපදිංචි කිරීමක් ලෙස MTA - 02 සමග නොව, වාහනයේ අයිතිය වෙනස් වීමක්/පැවරීමක් ලෙස වාහන පැවරීමකදී භාවිතා කරන MTA 06 සහ MTA 08 සමග අනෙකුත් සහයක ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු සිදු කරනු ලැබේ. ඒ අනුව වාහන පැවරීමකදී වාහන රේගුවෙන් නිදහස් කිරීමේදී නිකුත් කරන ලියකියවිලි, රේගු ගාස්තු ගෙවූ රිසිට්පත්, සහ අදාල ඉන්වොයිස්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව කාරුණිකව දන්වමි. | මෝටර් වාහන පනතේ 238 වන වගන්තිය අනුව ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම සඳහා වුවද ආනයනික ලියවිලි හා අදාල වන ලේඛන ඉදිරිපත් කල යුතු බැවින් ඊට අනුකූලව ක්‍රියාකල යුතුය. |
| (ii) | ත්‍රිවිධ හමුදාව විසින් කලින් කලට ටෙන්ඩර් කරන ලද වාහන පිළිබඳ විස්තර වගකිව යුතු ප්‍රධාන නිලධාරියකුගේ අත්සනින් යුතුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලබන අතර සිවිල් පුද්ගලයකු ත්‍රිවිධ හමුදාවෙන් මිල දී ගත් වාහනයක් ලෙස ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන සෑම | ලියාපදිංචි අංකවලට අදාලව මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක විස්තර අනුව මෙම සියළුම මෝටර් වාහන යුධ, ගුවන් හා නාවික හමුදාව පළමු ලියාපදිංචි අයිතිකරු ලෙස සඳහන් වේ. ඒ අනුව මෙම මෝටර් වාහන යුධ, ගුවන් හා නාවික හමුදා | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාවකදීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අයදුම්පතෙහි සඳහන් වාහනයෙහි විස්තර උක්ත ටෙන්ඩර් කරන ලද වාහන පිළිබඳ විස්තර සමඟ පරීක්ෂා කර එකී වාහනය ත්‍රිවිධ හමුදාවෙන් ටෙන්ඩර් කරන ලද වාහනයක්ද යන්න සහතික කරනු ඇත. එහෙත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලිපිගොනුවලට අනුව ත්‍රිවිධ හමුදාව විසින් එවා තිබූ ටෙන්ඩර් විස්තර සමඟ නොගැළපෙන හා ටෙන්ඩර් විස්තර මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දැනුවත් නොකළ ත්‍රිවිධ හමුදා වාහන 40ක් 325 කාණ්ඩය යටතේ ලියාපදිංචි කර තිබුණි. උක්ත වාහන ලියාපදිංචි තොරතුරු ඇතුළත් මුල් ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මඟින් වෙන්දේසි කරන ලද මෝටර් වාහන බවට මූලික වශයෙන් හඳුනාගත හැකිය.<br>2011 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකා යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් වෙන්දේසි කරන ලද මෝටර් ලියාපදිංචියට පෙර අභ්‍යන්තර විගණන අංශය මඟින් අදාල හමුදා බණ්ඩයෙන් විමසා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සිදු කරනු ලබයි.ඒ අනුව මෙම මෝටර් වාහන ලියාපදිංචියට පෙර යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් ටෙන්ඩර් මඟින් විකිණූ බවට තහවුරුවක් ලබාගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (iii) | ත්‍රිවිධ හමුදාවේ වගකිව යුතු නිලධාරියකුගේ අත්සනින් යුතුව ඉදිරිපත් වී ඇති ටෙන්ඩර් ලියවිලිවල සඳහන් වාහන 8ක් අදාල ටෙන්ඩර් කරන ලද දිනයන්ට පෙර දිනයන්හි දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිවිල් පුද්ගලයින් වෙත සන්තකය හුවමාරු වී තිබුණි. මේ අනුව ත්‍රිවිධ හමුදා වෙන්දේසිවලින් ලබාගත් වාහන ලෙස වෙනත් වාහනද ලියාපදිංචි වීමේ අවධානමක් නිර්මාණය වී තිබුණි. | ශ්‍රී ලංකා යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් මෝටර් වාහන වෙන්දේසි කර නිකුත් කරනු ලබන ලියකියවිලිවල එම මෝටර් වාහනය යුධ හමුදාවට පාවිච්චිය සඳහා ගත් දිනය ඇතුළු තොරතුරු ඇතුලත් ලේඛණයක් නිකුත් කරනු ලැබේ.<br>එම ලේඛණය පදනම් කර ගනිමින් ලියාපදිංචිය සඳහා තොරතුරු ලබා ගැනීම සිදු වේ. එහිදී යුධ හමුදාව පාවිච්චිය සඳහා යොදාගත් දිනය හෝ යුධ හමුදාව මඟින් ටෙන්ඩර් මඟින් විකුණන ලද දිනය හෝ මෙම වාහනය පරීක්ෂා කර බර සහතිකය (CMT 75) නිකුත් කළ දිනය පළමු ලියාපදිංචි දිනය ලෙස සළකනු ලැබේ.<br>තවද 325 අංක බාණ්ඩය ලබාදීම සඳහා දත්ත ඇතුලත් කරන විට, ලියාපදිංචි දිනය ලෙස දත්ත ඇතුලත් කරනු ලබන දිනය පරිගණකය මඟින් ස්වයංක්‍රීයව (AUTO) ලබා ගනී. මෙම දිනය දත්ත confirm කළපසුව ලියාපදිංචි සහතිකය මුද්‍රණයට පෙර වෙනස් කළ යුතුය. එම ක්‍රියාව සිදු කිරීමට අමතක වුවහොත් විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි දිනවල පරස්පරයන් දැකිය හැකිය.<br>මේ අනුව විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි වරදක් සිදුකර ඇති බවට හේතුව අදාල දිනයන් නිවැරදිව දත්ත ඇතුලත් කිරීම සඳහා යොදා | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | නොගැනීම බව පෙනී යයි. මෙම වරද නිවැරදි කිරීම සඳහා සියළුම උත්සාහයන් හැම විටම ගන්නා බවද සඳහන් කරමි.<br>මේ අනුව 325 අංක බාණ්ඩය ලබාදීමේදී මුල් ලියාපදිංචි දිනය තෝරා ගැනීම ගැටළුකාරී තත්ත්වයකට පත් වී ඇත. මේ නිසා මුල් ලියාපදිංචි දිනය සහ පැවරුම් දිනය අතර වෙනසක් දැකිය හැකිය. විගණනය මඟින් පෙන්වා දී ඇති මෙම වරද නිවැරදි කිරීම සඳහා උපදෙස් ඇතුළත් 3/2024 අංක 3/2024 හා 2024.03.12 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇත. | |
| (iv) | ත්‍රිවිධ හමුදාව විසින් පූර්ව ලියාපදිංචියකින් තොරව භාවිතා කරන ලද වාහන ටෙන්ඩර් ක්‍රියාවලියකින් පසුව සිවිල් පුද්ගලයින් වෙත අලෙවි කර ඇතත් එම වාහන ටෙන්ඩර් කර ඇති දිනයන්ට පෙර දිනයන්හිදී එකී වාහනවල මුල් ලියාපදිංචිය සිදු වී ඇති බව නිරූපණය වන පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ව්‍යාජ දත්ත ඇතුලත් කරමින් ත්‍රිවිධ හමුදාව විසින් ටෙන්ඩර් කරන ලද වාහන 29ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි. | -එම- | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |
| (v) | ත්‍රිවිධ හමුදා විසින් ටෙන්ඩර් කරන ලද වාහන වැසි අංක පරීක්ෂා කිරීමේදී ත්‍රිවිධ හමුදාවෙන් පුද්ගලයන් වෙත හුවමාරු වී ඇති වැසි අංක 04ක් සඳහා එම වැසි අංකයෙන්ම තවත් වාහන කිහිපයක් ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව එකම අංකයෙන් වාහනයක් ලියාපදිංචි වී තිබීම, නිර්ව්‍යාජ වැසි අංකය හා ව්‍යාජ වැසි අංකය හඳුනා ගැනීම, ත්‍රිවිධ හමුදාවෙන් ටෙන්ඩර් කල වාහන තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකල යුතු නමුත් එවැනි පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | පැරණි ඉලක්කම් අක්ෂර කාණ්ඩ යටතේ ට්‍රැක්ටර් ටේලර්, අත්ට්‍රැක්ටර් හා අනෙකුත් ඉඩම් වාහන ලියාපදිංචියේ දී සම්පූර්ණ වැසි අංකය භාවිතා කර නොමැති බව නිරීක්ෂණය වේ. එබැවින්, වැසි අංකයේ කාණ්ඩ කොටස ඉවත් කර අංක කොටස පමණක් උපයෝගී කරගෙන පොදුවේ ලියාපදිංචිය සිදු කර ඇත. මෙම අංක කොටස ඉලක්කම් හතරකින් හෝ පහකින් යුක්ත වේ. එක් කාණ්ඩයක් යටතේ මෝටර් වාහන 9500 ක් (එකතුව 13 හැර) පමණ ලියාපදිංචි වන හෙයින් මෙම ඉලක්කම් හතර ප්‍රමාණවත් නොවේ. එම නිසා එකම වැසි අංකයෙන් ඉඩම් වාහන කීපයක් ලියාපදිංචි වී තිබිය හැකිය. පරිගණක අනුසාරයෙන් තොරව මෝටර් වාහන ලියාපදිංචි කරන කාල වලදී මෙලෙස එකම වැසි අංකයක් යටතේ මෝටර් වාහන කීපයක් ලියාපදිංචි වී තිබීමේ හැකියාව පවතී. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | | ඒ අනුව, මෙලෙස එකම වැසි අංකයකින් අත්ට්‍රැක්ටර් හෝ ට්‍රැක්ටර් ට්‍රේලර් කීපයක් ලියාපදිංචි වී තිබීම සාමාන්‍ය වේ. නමුත්, වර්තමානයේ ඉංග්‍රීසි අකුරු ලියාපදිංචියේ දී මෙවැනි වැරදීමක් සිදුවිය නොහැකිය. | |
| (ඕ) | රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන ත්‍රිවිධ හමුදාව හෝ මූල්‍ය ආයතන විසින් යම් ලියාපදිංචි වාහනයක් සුන්බුන් ලෙස ඉවත් කිරීමට කටයුතු කිරීමේදී ඉවත්වන වාහනයේ ලියාපදිංචි සහතිකය වංචනික ක්‍රියාවන්ට යොමු වීම වැලැක්වීම සඳහා සියලුම සුන්බුන් වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට ක්‍රියාකල යුතු බවට අවශ්‍ය වන නීතිමය හා ප්‍රායෝගික ව්‍යුහයන් සකස් කර නොතිබුණි. | ත්‍රිවිධ හමුදාව මඟින් සුන්බුන් ලෙස විකුණන ලද වාහන සඳහා මෝටර් වාහනයක් ලෙස විකිණූ බවට තහවුරුවක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කිරීමක් සිදු නොකරනු ලබයි. විගණනය මඟින් ඉදිරිපත් කරනු ලබන කරුණු අනුව මෙලෙස සුන්බුන් ලෙස විකුණා ඇති වාහන වල වැසි අංකයට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබිය හැකි බව පිළිගනිමි. කෙසේ වෙතත් ඔබගේ නිරීක්ෂණය හා එකඟ වෙමින් මේ සඳහා අවශ්‍ය නීතිමය හා ප්‍රායෝගික ව්‍යුහයන් සකස් කිරීමට පියවර ගනිමි. | ලියාපදිංචි වාහනයක් සුන්බුන් ලෙස ඉවත් කිරීමට කටයුතු කිරීමේදී ඉවත්වන වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කල යුතුය. |
| (ක) | එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ චක්‍රලේඛ අනුව ලබාදුන් බලපත්‍ර මත ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (i) | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය නිකුත් කරන ලද අංක 02/2022 දරණ මුල් චක්‍රලේඛයේ 5.3 ඡේදය හා 02/2022(i) හා 2022.09.09 දිනැති චක්‍රලේඛය අනුව විදේශ රටක දී භාවිතා නොකළ හෝ ධාවන මනුව ශුන්‍ය හා නිෂ්පාදිත දින සිට වසර එකක කාලයක් ඇතුළත යන කොන්දේසි සම්පූර්ණ වන වාහන පමණක් ආනයනය කළ යුතුය. වාහන ආනයනයේ දී මෙන්ම වාහන ලියාපදිංචි කිරීමේ දී ඉහත කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට නිෂ්පාදකයාගේ සහතික, විදේශ රටක ලියාපදිංචි සහතික, පූර්ව ආනයනික භාණ්ඩ පරීක්ෂාවට අදාළ ලේඛන වැනි විෂයගත ලේඛන මගින් සනාථ කළ යුතු වුවත් එවැනි ලේඛන මගින් පූර්වෝක්ත චක්‍රලේඛ අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර නොතිබිය දී බලපත්‍ර මගින් ආනයනය කර තිබූ අවස්ථා 5ක දී තීරු බදු සහනයන් මත උක්ත වාහන නිදහස් කිරීමට මෙන් ම නිසි පරිදි ලේඛනගත තහවුරු කිරීමකින් තොරව රේගු සටහන්කරය තුළ "භාවිතා නොකළ" වාහනයක් බව සඳහන් කිරීමට රේගුව කටයුතු කර තිබූ අතර රේගු සටහන්කරයට අමතරව අනෙකුත් | මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව මඟින් නිකුත් කර ඇති CUSTOM 53, ASSESMENT NOTICE සහ ශ්‍රී ලංකා රේගුව මඟින් මෙම දෙපාර්තමේන්තුවට සම්ප්‍රේෂණය කරනු ලබන මෝටර් වාහනයට අයත් තොරතුරු ප්‍රධාන වේ. අදාල මෝටර් වාහනය ආනයනය සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇත්නම් එම බලපත්‍රයේ සඳහන් කොන්දේසි ද ප්‍රමුඛ වේ. විගණන විමසුම මඟින් සඳහන් කර ඇති පරිදි වාහන ආනයනයේදී හෝ වාහන ලියාපදිංචියේදී කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට නිෂ්පාදකයාගේ සහතිකය, බැටරිය බැහැර කිරීමේ වගකීම බලයලත් නියෝජිතයා භාර ගැනීම් ආදී වගකීම් සම්බන්ධයෙන් මෝටර් වාහන ආනයනයේදී ශ්‍රී ලංකා රේගුව මඟින් | රේගු සටහන්කරයට අමතරව අනෙකුත් ආනයනික ලියවිලි සමඟ සසඳා භාවිතා නොකල වාහනයක්ද යන්න තහවුරු කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආනයනික ලියවිලි කිසිවක් නොමැතිව උක්ත වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. | පරීක්ෂා කළයුතු කාර්යක් බව සඳහන් කරමි. එම ලේඛණ මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කටයුතු සඳහා ඉදිරිපත් කිරීමක් සිදු නොවන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. | |
| (ii) | වාහන ආනයනයේ දී සම්පූර්ණ කළ යුතු නිර්ණායකයන් ලෙස 02/2022 චක්‍රලේඛයේ 5.1 තුළ බැටරි ඇසුරුම හා විදුලි මෝටරය සඳහා අවම වශයෙන් වසර තුනක් සඳහාවත් නිෂ්පාදකයින්ගේ හෝ අපනයනකරුවන්ගේ වගකීමක් තිබිය යුතු ලෙස දක්වා ඇති අතර චක්‍රලේඛයේ 5.4 ඡේදය තුල එක් බල ආරෝපණයකින් අවම වශයෙන් ධාවන කිලෝමීටර් දෙසීයකට වඩා ධාවනය කළ හැකි විය යුතු ලෙස දක්වා ඇත. කෙසේ නමුත් උක්ත නිර්ණායකයන් සම්පූර්ණ වන බවට නිෂ්පාදකයාගේ හෝ අපනයනකරුගේ පිළිගත හැකි තහවුරුවක් සහිත ලේඛන ලබා ගැනීමකින් තොරව උක්ත වාහන ආනයනය කර තිබූ අතර චක්‍රලේඛ අවශ්‍යතාවයන් තහවුරු වන බවට ලේඛණ ලබා ගැනීමකින් තොරව බලපත්‍ර යටතේ ආනයනය කළ වාහන 108ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි. | මෙම මෝටර් වාහන ආනයනය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව මෝටර් වාහන ලියාපදිංචියට පෙර ආනයනය සඳහා බලපාන කොන්දේසි වලට අදාල ලේඛණ පරීක්ෂාව අදාල රේගුබදු අයකිරීමට පෙර රේගුව සතු කාර්යභාරයක් බවත්, රේගුව මඟින් නිකුත් කරනු ලබන CUSTOM 53 පදනම් කර ගනිමින් සහ අවශ්‍ය කරන අනෙකුත් ලියකියවිලි භාරගෙන ලියාපදිංචිය සිදුකරන බව සඳහන් කරමි. | අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022(iii) හි 2.2 ඡේදය 02/2022(iv) චක්‍රලේඛ අනුව 2022.05.17 දිනයට පෙර නිකුත් කරන ලද සියලුම බලපත්‍ර යටතේ ආනයනය කරන ලද වාහන 2023 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුවේ. එහෙත් චක්‍රලේඛයේ සඳහන් ලියාපදිංචි කළ හැකි අවසන් දිනෙන් පසුව චක්‍රලේඛ නිකුත් කළ බලධාරි ආයතනයන්හි අවසරයකින් හෝ අනුමැතියකින් තොරව, බලපත්‍ර යටතේ ආනයනය කළ වාහන දෙකක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි. | ලියාපදිංචි අංක CBM-XXXX දරණ මෝටර් රථය ශ්‍රී ලංකා රේගුව මඟින් 2023.11.09 දින නිදහස් කර ඇති බව රේගු ලියවිලි අනුව තහවුරු වේ. ඒ අනුව ලියාපදිංචිය සිදුවී ඇත. එමෙන්ම CBM-XXXX අංක දරණ මෝටර් රථය 2023.05.24 දින ශ්‍රී ලංකා රේගුව මඟින් නිදහස් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එම චක්‍රලේඛයට අනුව අදාල කාලය තුල මෙම රථ 02 ලියාපදිංචි වී නොමැති බව පිළිගන්නා අතර එය චක්‍රලේඛනය නිවැරදි ලෙස පරිශීලනය නොවීම නිසා සිදුවී ඇති බව කාරුණිකව සඳහන් කරමි. | අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | තීරු බදු ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ විදේශගත ශ්‍රමිකයින් විසින් ආනයනය කරනු ලබන වාහන, අදාළ විදේශගත ශ්‍රමිකයාගේ නමින් ලියාපදිංචි කළ යුතු අතර චක්‍රලේඛ අංක 02/2022(iii) 2.4 ඡේදය අනුව වසර දෙකක් යනතෙක් සන්තකය මාරු කළ නොහැකි වේ. එහෙත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව බලපත්‍ර මත ආනයනය කළ වාහන 6ක් එකී වාහන මුල් ලියාපදිංචි කළ දිනයේදීම හා එක් වාහනයක් මුල් ලියාපදිංචි දින | එකඟ වෙමි. අදාල නිලධාරීන් මේ සම්බන්ධයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ නිසි ලෙස පරිශීලනය කර නොමැති වීම හේතුවෙන් මෙම පැවරීම සිදුකර ඇත. එවැනි වරදක් ඉදිරියේදී සිදු නොවීම සඳහා කඩිනමින් අදාල අංශභාර නිලධාරියා දැනුවත් කර | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| | 5ක් ගතවීමේ පසුව වංචනිකව වෙනත් පාර්ශවයන්ට පැවරීමට කටයුතු කර තිබුණි. | අවශ්‍ය පියවර ගෙන ඇති බවද සඳහන් කරමි. තවද මෙම මෝටර් වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව මඟින් පරීක්ෂණයක් සිදු කරන බවද දන්වන අතර මුල් ගොනු ශ්‍රී ලංකා රේගුව විසින් විමසා මෙම දෙපාර්තමේන්තුවෙන් රැගෙන ගොස් ඇති බවද කාරුණිකව දැනුම් දෙමි. | |
| (v) | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022(i) හා 02/2022(iii)හි ප්‍රතිපාදන ප්‍රකාරව 2022 සැප්තැම්බර් 09 දින සිට 2023 මාර්තු 21 දින දක්වා බලපත්‍ර යටතේ ආනයනය කරනු ලබන වාහනයේ CIF වටිනාකමින් සියයට 10ක වටිනාකම ඇමෙරිකානු ඩොලර් වලින් ගෙවීමෙන් පසුව පාර්ශවයකට පැවරීමට හැකි ලෙස ප්‍රතිපාදන ඇතුළත්ව තිබූ නමුත් උක්ත පැවරීමට තිබූ විධිවිධාන 2023 මාර්තු 21 දිනෙන් අවසන් වී තිබුණි. එහෙත් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවන සේ චක්‍රලේඛ ආවරණය බලාත්මක නොවන දිනයක් වන 2023 මාර්තු 22 දින, බලපත්‍ර ක්‍රමය යටතේ ආනයනය කරන ලද එක් වාහනයක CIF වටිනාකමින් සියයට 10කට සමාන රුපියල් අගයක් ගෙවීමෙන් පසුව වෙනත් පාර්ශවයකට සන්තකය මාරු කර දීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි. | ලියාපදිංචි අංක CBM-XXXXට අදාල මෝටර් රථය 2023.02.28 දින ශ්‍රී ලංකා රේගුව මඟින් නිදහස් කර ඇති අතර, ලියාපදිංචිය 2023.03.17 දින සිදු කර ඇත. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛණය අනුව මෙම රථය 2023.09.30 දිනට පෙර ලියාපදිංචි වියයුතු බව සඳහන් වුවත් CIF වටිනාකමින් 10% ක් අයකර පැවරීම සිදු කිරීමට ඇති හැකියාව 2023.03.21 දිනෙන් අවසන් බවට 2023.03.21 නිකුත් කර ඇති 02/2022(III) චක්‍රලේඛණයේ සඳහන් වුවද මෙම චක්‍රලේඛණ යේ විධිවිධාන 2023.03.22 වැනි දින වන විට මෙම දෙපාර්තමේන්තුවට වාර්තා නොවීම හේතුවෙන් මෙම පැවරුම සිදුවී ඇති බව සඳහන් කරමි. මෙම පැවරීමට අදාලව CIF වටිනාකමින් 10% ක් ලෙස රු. 898,978/- ක මුදලක් ගෙවා ඇත. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |
| (vi) | ඉහත යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීමට අදාළ රජයේ බදු ඇතුළු සියලු වියදම් පියවීම සඳහා විධිමත් ලෙස බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය භාවිතා කළ යුතු අතර ආනයනය කරන ලද වාහන සඳහා කල්බදු පහසුකම් ලබා ගැනීමට චක්‍රලේඛ මගින් ප්‍රතිපාදන සලසා දී නොතිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර අතර ආනයනය කරන ලද එක් වාහනයක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර 2023.10.27 දින වාහනයේ පරම අයිතිය මූල්‍ය සමාගමක් වෙත පවරා දී කල්බදු පහසුකමක් ලබා ගෙන තිබුණි. | මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 02/2022, 02/2022(I), 02/2022(III) හා 02/2022(IV) චක්‍රලේඛණ අනුව මූල්‍ය පහසුකම් ලබාගැනීමට නොහැකි බවට කිසිදු සඳහනක් නොවන බව කාරුණිකව දන්වා සිටිමි. නමුත් විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි වර්තමානයේ ලියාපදිංචි වන මෝටර් වාහන සඳහා මූල්‍ය පහසුකම් ලියාපදිංචි කිරීමක් සිදු නොකරන බවද දන්වමි. | කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය |
| (ග) | රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කරන කාඩ්පත් ඉදිරි මාස තුනකට පමණක් ප්‍රමාණවත් වන බැවින් කඩිනමින් මිලදී ගන්නා ලෙස කොමසාරිස් (රියදුරු බලපත්‍ර) විසින් 2024 ජනවාරි මාසයේ දී ගිණුම් අංශය වෙත දැනුම් දී ඇතත් 2024 මැයි මාසය දක්වා රියදුරු බලපත්‍ර මිලදී ගැනීමට | පසුගිය වසර 3ක් හෝ ඊට වැඩි කාලයක මෙම දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර මිලදී ගැනීම් ප්‍රසම්පාදනයක් සිදු කර නොමැත. එබැවින් මෙය විශේෂිත ප්‍රසම්පාදනයක් ලෙස සිදු කිරීම පහත | රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කරන කාඩ්පත් කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු නොකිරීම හේතුවෙන් රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කටයුතු ඇනහිටීම හෝ පෞද්ගලික අංශය මගින් ඉහළ මුදලක් ගෙවා මුද්‍රණය කරවා ගැනීමේ අවධානමක් ජනනය වී තිබුණි. | කාල රාමුව තුල ඉටු කර ඇත. 2024.01.18 දින වේරහැර කොමසාරිස් (රියදුරු බලපත්‍ර) විසින් ඉල්ලීම් කල පසු 2024.01.29 නව රියදුරු බලපත්‍ර සඳහා පිරිවිතර සකස් කිරීමට තොරතුරු තාක්ෂණ අංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව 2024.02.09 පිරිවිතර සකස් කර දී ඇත. 2024.02.14 තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර ලංසු ලේඛන අනුමත කර අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. 2024.03.05 අමාත්‍යාංශ අනුමැතිය ලැබුණු පසු 2024.03.06 පුවත්පත් දැන්වීම් පල කර ඇත. මුල් ලංසු ලේඛන අනුව 2024.03.27 ලංසු ලේඛන විවෘත කිරීමට අනුමත වුවත් 2024.03.18 දින ලංසුකරුවන් සමඟ පැවති (per bid meeting) මඟින් ලංසු විවෘත කිරීම 2024.04.10ට දීර්ඝ කරන ලදි. පසුව අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව 2024.04.19 දක්වා ලංසු විවෘත කිරීම දෙවන වරටත් දීර්ඝ කරන ලදී. මේ වන විට විවෘත කල මිලගණන් ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි. | |
| (ච) | රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා වේරහැර කාර්යාලයේ මුද්‍රණ යන්ත්‍ර තුනක් හා හම්බන්තොට අනුරාධපුර කාර්යාලවල එක් මුද්‍රණ යන්ත්‍රය බැගින් මුද්‍රණ යන්ත්‍ර පහක් භාවිතා කර නමුත් වර්තමානය වන විට ඉන් මුද්‍රණ යන්ත්‍ර දෙකක් භාවිතයට ගත නොහැකි සේ අක්‍රිය වී ඇත. නැවත එකී මුද්‍රණ යන්ත්‍ර දෙක ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියේදී දැඩි ලෙස අකර්මන්‍ය වීමට හෝ ඉහළ මුදලක් ගෙවා පෞද්ගලික අංශයෙන් මුද්‍රණය කරවා ගැනීමට සිදුවීමේ අවධානමක් ඇති වී තිබුණි. | රියදුරු බලපත්‍ර මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා යන්ත්‍ර නියෝජිත ආයතනය වන මෙට්‍රොපොලිටන් ආයතනයෙන් ඉදිරිපත් කල මිල ගණන් අනුව යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. | රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ යන්ත්‍ර කිහිපයක් කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කල යුතුය. |